HNB GRAMEEN

# මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

— 2017 සැප්තැම්බර් - ඔක්තෝම්බර් කලාපය —

"...මිනිසා අයිති වන්නේ මහපොළොවටයි. ඥාතීන් සියලු දෙනා එකම ලේ බැම්මකින් බැදෙන්නාක් මෙන් මෙලොව ඇති සියලු දෑ ද එකිනෙකට බැඳී පවතී. ජීවන ජාලය වියන ලද්දේ මිනිසා විසින් නොවේ. ඔහු හුදෙක් එහි එක් වරපටක් පමණකි. ඔහු මෙම ජීවන ජාලයට යම් බලපෑමක් කරයි ද, හෙතෙම එය තමන්ටම සිදුකරගත්තා වේ..."

රතු ඉංදියානු නායක සියටල් මීට වසර ගණනාවකට පෙර කළ මේ ප්‍රකාශය එදාටද වඩා වලංගු වන්නේ අදටය. ඒ අප නොදැනුවත්වම මේ මහ පොළොව විනාශ කරමින් සිටින හෙයිනි.මේ විනාශය ගැන එකිනෙකාට ඇගිලි දිගු කරමින් නොසිට අපි ඒ සඳහා පෙරමුණ ගනිමු. හැකි උපරිම අයුරින් පොලිතින් භාවිතය අවම කරමු.එය අපේ කෑම පාර්සලයේ සිට හැකි සෑ කළ හැකිය.ග්‍රාමීන් අපි මේ මහ පොළොවේ සුරක්ෂිතතාව වෙනුවෙන් අපේ යුතුකම ඉටුකරමු.

**ඔව්...එය අපට කළ හැකියි...!**





# පරිසරය සුරැකීම වෙනුවෙන්...
# පොලිතීන් පිටුදැකීමේ විප්ලවය...
# HNB ග්‍රාමීන් අපි ඇරඹූ වගයි.



ජීවිතයට අරුතක්

# බෝම්බ කොන්ත්‍රාත්කරුගේ පුත් නොබෙල්ගේ අන්තිම කැමති පත්‍රය




**එම්මානුවෙල් නොබෙල් යනු බෝම්බ නිෂ්පාදන විශේෂඥයෙකි. ඔහුගේ පුත්‍රයා ගේ නම ඇල්ෆ්‍රඩ් නොබෙල්ය. මොහු 1833 ඔක්තෝම්බර් 21 ස්වීඩනයේ ස්ටොක්හෝම් හී දී උපත ලැබීය. ඇල්ෆ්‍රඩ් ඉපදෙන විට එම පවුල සිටියේ දැඩි ආර්ථික අර්බුදයන්ට මුහුණ පාමිනි. ඇල්ෆ්‍රඩ්ගේ වයස අවුරුදු 09 පමණ වන තෙක් මෙම පවුලේ දැඩි ආර්ථික ගැටළු පැවතුණි. නමුත් 1942 දී ආර්ථික අර්බුදයට තිත වැටුනි. එයට හේතුව වූයේ රුසියන් රජය බෝම්බ නිපදවීමට කොන්ත්‍රාත්තුවක් ලබා දීමයි. ඒ සමඟම මුළු පවුලම 1842 දී රුසියාවේ ස්ථිර පදිංචියට පිටත් විය. රුසියාවට ගිය පසු නොබෙල්ගේ පුතුන් දෙදෙනාටම හොඳ අධ්‍යාපනයක් ලබා දීමට හැකි විය. ඒ නිසා ඇල්ෆ්‍රඩ් තරුණයා රසායන විද්‍යාව පිළිබඳ ඉහළටම හැදෑරීමට අවස්ථාව උදා කර ගන්නා ලදී.**


**කැරොලිනා ඇන්ඩ්‍රියෙට්**
නොබෙල්ගේ බිරිය

පසුව ඇල්ෆ්‍රඩ් තවදුරටත් විෂය ඉගෙන ගැනීම සඳහා ඇමරිකාවට පිටත් විය. වසර කීපයක අධ්‍යාපනයෙන් පසුව නැවතත් රුසියාවට යන ඇල්ෆ්‍රඩ්ට මුළු පවුලම සමඟ නැවත 1859 දී රුසියාවට පැමිණීමට සිදුවේ. එයට හේතුව නම් රුසියාව ක්‍රිමියානු රට සමඟ කළ යුද්ධය අවසන් වීමයි. ඉන් පසුව පියා සහ දරුදෙදෙනා ස්වීඩනයට නැවත පැමිණ පුපුරන ද්‍රව්‍ය කම්හලක් අරඹා වැඩ කටයුතු කර ගෙන යන අතුරතුර එම වැඩපළේ පුපුරන ද්‍රව්‍ය පුපුරා යාමෙන් ඇල්ෆ්‍රඩ්ගේ සොහොයුරා මරණයට පත්වන අතර පියා සාදාකාලික අංග විකල තත්වයට පත්විය. ඉන්පසුව ස්වීඩන රජය මෙම ව්‍යාපාරය තහනම් කර නවතා දැමීමට නියෝග කරන ලදී.

රජය මෙය නවතා දැමීම නිසා නැවතත් ඇල්ෆ්‍රඩ්ට දැඩි ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවිය. ඒ නිසා ඔහු විසින් ධීවර යාත්‍රා නිෂ්පාදනය කරන ආයතනයක් පවත්වා ගෙන යන මුවාවෙන් නොනවත්වාම පුපුරන ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ වල නියුතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1866 දී ඩයිනමයිට් නමැති පුපුරන ද්‍රව්‍ය ලොවට හඳුන්වා දීමට ඔහුට හැකි විය. මෙම නම මුලින් සඳහන් කර ඇත්තේ ඩයනමික් ලෙසයි. එය ග්‍රීක භාෂාවෙන් හමුදාව යන්නයි. පසුව මෙය ඩයනමයිට් ලෙස ඇල්ෆ්‍රඩ් විසින් නම් කර ඇත. මේ සොයා ගැනීම වෙනුවෙන් ඇ.එ.ජ. සහ බ්‍රිතාන්‍යයෙන් පේටන්ට් බලපත්‍රය ඇල්ෆ්‍රඩ් විසින් ලබා ගන්නා ලදී. ඉන්පසු මොහු විවිධ රටවල කර්මාන්ත ශාලා පවා ආරම්භ කරන ලදී.

ඉන් පසුව මොහු විසින් නොකඩවා කරන ලද පර්යේෂණ වල ප්‍රතිඵල ලෙස නයිට්‍රෝ සෙලියුලස්, ජෙලටින්, බ්ලාස්ටින් නමැති පුපුරන ද්‍රව්‍යයන් ද සොයා ගනු ලැබීය. ඔහුගේ අවසාන කාලයේ ඩයිනමයිට් නිපදවීම පිළිබඳව ඔහුම දැඩි කලකිරීම් වලට පාත්‍ර විය. එහි ප්‍රතිඵලයක් වූයේ ඔහු තම ධනයෙන් විශාල කොටසක් සමාජ සේවය සඳහා යොමු කිරීමයි. ඩයිනමයිට් හා වෙනත් පුපුරන ද්‍රව්‍ය නිසා ලෝකයේ සිදු වූ දරුණු යුධ තත්වයන් හා ජීවිත විනාශ වීම් දැකීමෙන් හටගත් මානසික කම්පනයෙන් නොබෙල් ජීවිතයේ අවසන් කාලය ගතකළේ දැඩි මානසික කළකිරීමකිනි. එය ඔහුට ඉතා දැඩි මානසික පීඩාකාරී තත්වයක් විය. ඔහු එකල උපයාගත් ධනයෙන් ඩොලර් මිලියන 9 ක් ස්වීඩන් බැංකුවක තැන්පත් කරන ලදී. පසුව ඔහු 1886 දී මිය යන අතර මිය යාමට පෙර ඔහු විසින් ලියන ලද අවසන් කැමති පත්‍රයේ මෙසේ සඳහන් කර තිබුණි. එනම්, ඩොලර් මිලියන 9 න් ලැබෙන පොළියෙන්




ලෝකයේ මානවයාගේ යහපත උදෙසා කටයුතු කරන අයට එම පොළිය ලබාදෙන ලෙස ලියා තබා ඇත.

එම ක්ෂේත්‍රයන්ද ඔහු විසින් නම් කර ඇත. එනම් 1) භෞතික විද්‍යාව 2) රසායන විද්‍යාව 3) වෛද්‍ය විද්‍යාව 4) සාහිත්‍ය 5) ලෝක සාමය ඉහත කී අංශ සඳහා කැපවන අයට මෙම ත්‍යාග පිරිනැමීමට ඔහු සටහන් තබා ඇත. ලෝකයේ අතිශයින් ජනප්‍රිය නොබෙල් ත්‍යාගලාභීන් බිහිවන්නේ ඇල්ෆ්‍රඩ් නොබෙල් ඇරඹූ එම අරමුදල නිසාවෙනි. එම අරමුදල නම්කර ඇත්තේ ද නොබෙල්ගේ නමිනි. නොබෙල් ත්‍යාගලාභීන් අද වන විට ලෝකය පුරාම විසිරී සිටියි. ඔවුන්ව ඇගයීමට නොබෙල් ගත් උත්සාහය අනභිබවනීයයි. වර්තමානයේ නොබෙල් අරමුදල සම්බන්ධිකරණය කරනුයේ ස්වීඩනය සහ නොර්වේ රටවල් 2 ක විසිනි. නොබෙල් ත්‍යාග ප්‍රදානය අතිඋත්කර්ශවත් ලෙස සෑම වසරකම දෙසැම්බර් 10 දින සිදු කරනු ලබනවා. මෙම පදනම මඟින් 1900


**ඩයිනමයිට් නම් වූ ඒ අපූර්ව සහ ලොවක් කැළඹූ සොයාගැනීම**

සිට මේ දක්වාම ඉහත කී ක්ෂේත්‍ර සඳහා නොබෙල් ත්‍යාග පිරිනැමීම සිදු කරනු ලබනවා.

ඇල්ෆ්‍රඩ් නොබෙල් යනු ලෝකයම වුවද විනාශ කිරීමට හැකි පුපුරන ද්‍රව්‍ය නිපදවූ අයෙකු වුවත් අවසානයේ තමන්ගෙන් වූ මහා අපරාධයට වන්දි ගෙවීමක් වශයෙන් ඇරඹූ නොබෙල් ත්‍යාග අරමුදල නිසා ඔහුගේ ප්‍රතිරූපය අංශක 360⁰ කින් වෙනස් කර ගැනීමට ඔහුටම හැකිවිය. පණ පිටින් සිටින විට මානවයින් ඔහුට සාප කළද මියගිය පසු සාප කිරීම් වෙනුවට ඔහු ලෝකයේ ගෞරවයට හා ආදරයට පාත්‍ර විය. එයට හේතුව නම් නොබෙල් අරමුදල නමින් ලෝකයේ මානවයන් කරනු ලබන යහපත් දේ වෙනුවෙන් අරමුදලක් පිහිටුවීමයි. අපටද නොබෙල් ත්‍යාග වලට හිමිකම් අහිමි වුවද හැකි මට්ටමින් අපට අප රට වෙනුවෙන්වත් රටට දැනෙන යම් දෙයක් කළ හැකි නම් අප රටේ ඔබ අප නාමය සදාකල් පවතිනවා ඇත. ඔබත් දැන් සිට රටට දැනෙන, මිනිසාට දැනෙන යමක් කළ යුතුමය යන්න ඔබ සිතට ඇතුලත් කර ගන්න. එවිට ඔබත් රටේ වටිනාකම් සහිත අයකු වනවා නියතය. ඔබ වැනි මිනිසුන් අප රටට සුවිශාල වශයෙන් අවශ්‍යව ඇත. අප රටට කළ හැකි උපරිමය කිරීමට අදිටන් කර ගන්න.


**ප්‍රේමසිරි ගමගේ**
සභාපති, ව්‍යාපාර සංවර්ධන කේන්ද්‍රය.



# ග්‍රාමීන් සේවක උපහාර ගීතය නිමැවුණු අයුරු

## අපේ දෙවැනි ගෙදර

අඳුර දුරලන සොඳුරැ මෙහෙවර
මවයි අපගේ සිනා හරසර
පැතුම් ඔක්කොම සැබෑ කරවන
දෙවෙනි වන්නේ අපේ ගෙදරට

වැසි දියෙන් නෑ තෙමුනෙ මා
දහදියෙන් හද තෙත්වුණා
දුවිලින් නෑ දැනුනෙ මා
සිනහවෙන් අප සරැවුණා

පුංචි මිනිසෙකු සොයා ගෙස් අපි
මහා මිනිසුන් බිහිකළා
වෙනස් මිනිසෙකු වුනේ සැම අපි
පැතුම් අරමුණු හොඳ නිසා









# ගීතයක කතාව

මියුරු සත්සර අතරෙහි රැඳවූ මේ පදවැල් සහිත ගැයුම ඔබට නුහුරු නුපුරුදු එකක් නෙවෙයි.ග්‍රාමීන් ජීවන තේමාව වදන් චිත්‍රයකට හරි අපූරු ආකාරයට නැගූ මේ පද වැලේ වගේම ගායනයේත් ඒ වගේම රූප රචනාවෙත් හිමි කරු එකම පුද්ගලයෙක්. ඔහු අමිල නිදහස.ක්ෂේත්‍ර ගණනාවක රසභාව ස්පර්ශ කළ හැකි නිපුණතාවක් ඔහු සතු වීම විශේෂත්වයක්. ''අඳුර දුරලන සොඳුරු මෙහෙවර'' ගීතය නිමැවුම පසුපස වූ පසුබිම් කතාවත් ගීතය තරම්ම සුන්දරයි.ගීතයට පසුබිම් වූ ඒ කතාව අමිල වචන වලට නැංවුවේ මෙහෙමයි.

මේ ගීතය නිර්මාණය කරන්න පාදක වුණු හේතුව වුණේ Great Place to Work සම්මානය වෙනුවෙන් ඉදිරිපත්කරන්න විනාඩි දෙකතුනක වීඩියෝ එකක් HNB ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂතුමාට අවශ්‍ය වුණා. දවස් කීපයක් විතරයි මේ ඉදිරිපත් කිරීම සඳහා තිබුණේ.මේ ගැන කතා කරන්න අපි HNB එකට ගිය හැම වාරෙකම මම දැක්ක දෙයක් තමයි ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ ඉදන් හැම සේවකයකු තුළම තිබුණු සුහද ශීලී බව සහ කාර්යක්ෂමභාවය.මම වීඩියෝ එක නිර්මාණය කරන්න අවශ්‍ය ගීතය නිර්මාණය කළේ මේ දේවල් ඔලුවෙ තියාගෙන. ගීතයේ පද ටික දැක්කාට පස්සෙ මුලින් හිතාගෙන හිටපු දේට සම්පූර්ණ වෙනස් දේකටයි කළමනාකාර අධ්‍යක්ෂ තුමාගේ හිත ගියේ. ඒ අනුව ඒ තරගය ගැන හිතන්නෙ නැතිව කාලය අරගෙන හොඳ නිර්මාණාත්මකව මේ ගීතයේ රූප රචනාව කරන්න කියලා ඔහු කිව්වා.

**මොකද ගීතයෙන් ග්‍රාමීන් සමාගමේ කාර්ය මණ්ඩලයේ කැපවීම ,ගනුදෙනුකරුවන් හා බැඳුණු සුහදතාවය, ආචාරශීලීබව මෙන්ම සමාජ මෙහෙවර පිළිබඳවත් හොඳින්ම කියවෙන බවයි එතුමන්ගෙ අදහස වුණේ. තරගයක් සඳහා ඉදිරිපත්කිරීමට වඩා මේ ගීතය ඔහුගේ කාර්ය මණ්ඩලයට කෘතඥපූර්වක ප්‍රසාද තිළිණයක් ලෙස පිරිනමන්නයි කළමනාකාර අධ්‍යක්ෂතුමාට අවශ්‍ය වුණේ.**

ගීතය ඇසුරෙන් එහි රූප රචනාව නිමැවීම භාර වුණොත් අමිලගෙ "4 th February" ප්‍රඩක්ෂන් හවුස් එකටමයි.ඒ අනුව ගීතය රූපගත කිරීම් සඳහා තිස්සමහාරාමය, නුවර එළිය, රණාල කියන ප්‍රදේශ තෝරා ගැනුණා. අදාල චරිත තෝරාගත්තේ කැළණිය විශ්ව විද්‍යාලයේ නාට්‍ය හා රංගකලාව හදාරණ විද්‍යාර්ථීන්ගෙන්. මේ දවස් ටිකේ හොඳටම පෑවිල්ල. ගීතයේ කොටසක වැසි දියෙන් නෑ තෙමුණෙ මා කියන කොටසට මහා වැස්සක තම ගනුදෙනු කරුවන් සොයා යන ග්‍රාමීන් නිළධාරියකු ගේ ජවනිකාවක් අන්තර්ගතයි. මේ කොටස ගන්න අපි කෘතිම වැස්සක් නිර්මාණය කරන්න අවශ්‍ය සියළු ආම්පන්න අරගෙනයි අදාල තැනට ගියේ. රූප ගත කිරීම් පටන් ගත්තා විතරයි කවුරුවත් නොහිතපු විදිහට මහා හයියෙන් වහින්න ගත්තා. මේකෙ සමහර දර්ශන වලට ඒ ගම්වල උදවියම අපි සහභාගී කරගත්තා. කොහොම වුණත් සම්පූර්ණ රූපගත කිරීම් වලට දවස් තුනක් වැයවුණත් අපි හිතන් හිටපු විදිහට ගීතය නිර්මාණය කරන්න ලැබීමේ සතුට වඩාත් තහවුරු වුණෙ චමින්ද ප්‍රභාත් මහතාගේ හිතේ ඇඳිලා තිබුණු විදිහටම රූප රචනාව තියෙනවා කියලා ඔහු බොහෝම සතුටින් ප්‍රකාශ කරපු මොහොතෙයි.
ගීතයේ සංගීතය සහ ගැයුම අමිල නිදහස විසින්ම සිදුකරද්දි එහි ද්‍රවිඩ ගීතය සඳහා නවාස් ඇනොන් ඉතා අපූරුවට සිය හඩ මුසු කළා. ද්‍රවිඩ ගීතයේ පද සිංහල ගීය ඇසුරෙන් නිමැවීමේ වගකීම භාරගත්තේ රේස් ඇන්ඩ් රෝඩ්ස්හි පෝල් ජයසීලන් විසින්. ඉතින් මේ හැමෝගෙම එකමුතුවෙන් නිර්මාණය වුණු HNB ග්‍රාමීන් සේවක උපහාර ගීයේ හිමිකම දැන් ඔබ සතුයි.



**අමිල නිදහස**



**නිරූපණ ශිල්පී - තිලංක**

**-සටහන-
දහම්සා
තිසරංගි**

**අන් අයගේ කියුම් කෙරුම් ඔබට වැදගත් නොවේ.**

# සහෘද සංවේදනා එක්තැන් කළ පත් ඉරුව



# පහන් තැව



## ඇස නැවතුණු තැන්



පින්තූරෙකට පණ දිය හැකිනම් මිතුරේ
පණ වැනි මිතුරුදම විහිදෙයි නෙත් අතරේ
මුහුණු පොතේ වැටෙයිද මේ පින්තූරේ
ලයික් කොමෙන්ට් ෂෙයාර් වෙයිද මේ වාරේ

යන එන ගමන හමුවෙන තැන සරු සාරයි
සිනහව කඳුල එකමුතු වුනු හැටි මාරයි
නැති වුනු දාට එක ළග උන් සිත් පාරයි
මතකය අපේ අද සෙල්ෆියකට බාරයි

අදහස - තිළිණ දිසානායක

## පාපොච්චාරණය

අළුත කැන්දන් ආව දින සිට
නුඹයි ගෙපැළම හැඩ කළේ
මෙතෙක් නොතිබුණු පහන් දැල්වුණි
අඳුරු දුප්පත් මගෙ පැලේ
බීමතින් හිංසා කරද්දිත්
වදනකුත් නෑ පිටකළේ
සුරා ගඳ ඉහිළුවා රන්කඳ
නිදියද්දි එක අගුපිළේ

විටෙක නුඹෙ ඔය අහිංසකකම
සිතට වදයක් වුණි මගේ
බීලා ආවම ගුලි වුණා නුඹ
මුල්ලකට පූසෙක් වගේ
ටිකෙන් ටික දියවෙලා යද්දිත්
ආදරේ ඉස්සර වගේ
නුඹේ වෙනසක් දුටුවෙ නෑ දුක්
ඉහිළුවේ මහමෙර වගේ

පැදුරේ දූවිලි පුසුඹ විඳගෙන
දුක් වින්ද මගේ රන්කඳ
පව්කාර මගෙ දෑත් වලටම
නුඹේ හිත කය රිදුනිද
එදා හොඳටම රණ්ඩු වෙනකොට
නපුරු තැනකට වැදුනද
ඉතින් පිංකඳ පව්කෙරූ මා
දමා සුරලොව යනවද.....?

මෙත්මා කරලියද්ද - නුවර ශාඛාව

## -- ගුරු පද හරසර --

දැනුම කිරට හරවා පෙවූ අපෙ මෑණී
ඔවදන් වලින් සිත සැනසූ පියාණෙනී
හරිදේ වැරදි දේ පෙන්වූ ගුරු දෙවුණී
ලෝකය ඔබ අතින් මැවුණා සේ දැණුනී

තැලී වැටී පෙරලෙන මේ මඩ ගොහොරේ
වැටී නොයන්නට මග පෙන්වූ ඇඳුරේ
පිපී සුවඳ දී දිදුලන මේ භවයේ
මඟ පෙන්වුවේ ඔබ නොවෙදෝ ඇඳුරිදුනේ

කුල මල අපේ ජාතිය ගැන නොසොයා
හිරු මෙන් සැමට ආලෝකය විහිදවලා
සඳ මෙන් සැම සිතට සිසිලස දනවාලා
විදු බිම එළිය කරනා දෙවියන් වැඳලා

සාගර ජලය තරමට ඔවදන් දුන්නා
සූරිය මඬල මෙන් ආලෝකය විහිදන්නා
පිච්ච මලක් මෙන් සුවඳක් විහිදෙන්නා
වීරිය ඔබේ අගයමි විලසින දන්නා

- ලක්ෂාන් මධුශංක

## අහිමි වූ පුතනුවනි



ලොව උතුම් වූ පදවිය
මව් පදවිය වූවත්
එය දැරීමට පිං කළත් මා...
මා ගතම දවාගෙන
කුණාටුවක් සේ හඹා ආ මාරයා
කිසිවෙක් නැති මොහොතක
මා පුතුව රැගෙන ගියේ මන්ද,
අන්ධකාරයේ ලා මැණියන්
මුළු දිවිය පුරාවට...

05.08.2017 දිනට යෙදුණු විහග සත්සර සොයුරාගේ තුන් මස් සැපිරුම නිමිත්තෙන් ඔහුගේ මව විසින් පබඳින ලද්දකි.

## නුඹ...

සිතට නැග එන
සෑම හැඟුමක
නුඹේ නම ඇත
සිතුවමක් මෙන්...
දකින සිහිනෙක
රැඳුණු දසුනක
නුඹේ රුව ඇත සෙනෙහසින්...
ලියන පන්හිඳ
මවන කවියක
නුඹේ නම ඇත
ගලපමින්...
නැගෙන හසරැළි
ගෙනෙන හැඟුමද
සොරාගෙන ඇත
නුඹ සෙමින්...

S. නදීකා ශ්‍රියානි
පුත්ලම ශාඛාව





# පුද්ගලයෙකු ව්‍යවසායකයකු වීම සඳහා පොළඹවන සාධක



**ව්‍යවසායකයකු වීමට පුද්ගලයෙකු අභිප්‍රේරණය කරනු ලබන සාධක කිහිපයකි.**

01. සිය ව්‍යාපාරයේ ප්‍රධානියා තමාම වීමේ අවශ්‍යතාව/තමා තමාගේ ප්‍රධානියා වීමේ අවශ්‍යතාවය
02. විවිධත්වය හා විශ්මය ජනක කටයුතු වල නියැලීමේ අවශ්‍යතාවය
03. තමාගේ පුහුණුව, දක්ෂතා හා කුසලතා වලින් උපරිම ඵල නෙලා ගැනීම
04. තමාගේ ක්‍රියා පිළිවෙලට වැඩ කිරීමේ නිදහස සලසා ගැනීමට/ස්වාධීනව කටයුතු කිරීමට/පූර්ණ නිදහස
05. නව ව්‍යාපාර අවස්ථා වලට යොමුවීම හෙවත් නව අභියෝග වලට මුහුණ දීමට ඇති කැමැත්ත
06. අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා වූ පෞද්ගලික වින්දනය සඳහා / පෞද්ගලික තෘප්තිය

**ව්‍යවසායක්තවය සාර්ථක වීම සඳහා අවශ්‍යයෙන්ම තිබිය යුතු සාධක :**

ව්‍යාවසායකයාගේ කර්තව්‍යය වන්නේ වෙළඳපල ගවේෂණය කර, අවස්ථා හඳුනාගෙන ඊට ගැළපෙන නිෂ්පාදිත බිහි කිරීමයි. එනම් වෙළඳපල පරාසය හඳුනාගැනීම හා එය පිරවීමට යෝග්‍ය නිෂ්පාදනයක් බිහි කිරීමයි. මෙම ක්‍රියාවලිය සිදුවන්නේ අවිනිශ්චිත පරිසරයක් තුළයි. එබැවින් සාර්ථක ව්‍යාවසායකත්වයක් සඳහා ප්‍රධාන අවශ්‍යතා කිහිපයක් තෘප්ත කරගත යුතුවේ. ඒවානම්,

01. තමාගේ දුර්වලතා හා ශක්තීන් හඳුනාගෙන තිබීමයි. (තමා පිළිබඳ හොඳ අවබෝධයක් තිබීම)
02. ඉදිරියේ දී සක්ෂාත් කර ගැනීමට හැකි අදහසක් ගොඩනගා ගැනීමයි.
03. ව්‍යාපාර අදහස් ක්‍රියාත්මක කිරීමට සුදුසු පරිසරයක් පැවැත්වීමයි. (ව්‍යාපාර අවස්ථා පැවතීම)
04. මූල්‍ය, මානව, භෞතික ආදී සම්පත් තිබිය යුතුය. (සම්පත් පැවතීම)
05. සැලසුම් කිරීම, සංවිධානය, මෙහෙයවීම හා පාලනය සාර්ථකව සිදුවීමයි. (මනා කළමනාකරණයක් තිබීම)

ජෙෆ්රි ටිමන්ස් ඉදිරිපත් කර ඇති ආකාරයට අවිනිශ්චිත පරිසරයක් තුළ ව්‍යාවසායකත්වයේ සාර්ථකත්වය උදෙසා උසස් වෙළඳපල අවස්ථා ප්‍රමාණයක් සම්පත් හා පළමු පන්තියේ කළමනාකාරන කණ්ඩායම් සහිත සුපිරි ව්‍යවසායකයකු යන සාධක තුන අතර මනා අන්තර් සම්බන්ධතාවයක් පැවතිය යුතුය. එබැවින් ඒවා ව්‍යවසායකත්වයේ නියමු සාධක (Three driving Force) ලෙස හැඳින්වේ.




**ව්‍යවසායක්වය සාර්ථක වීමට ප්‍රධාන සාධක 3 ට අමතරව තවත් සාධක හඳුනාගත හැකිය. ඒවා 9 Fs ලෙස හැඳින්වේ. එනම්,**

1. පුරෝගාමිකයකු වීම (Founders)
2. ඉලක්කගත වීම (Focused)
3. වේගවත් වීම (Fast)
4. නම්‍යශීලී වීම (Flexible)
5. වෙහෙසකාරී නොවන නවෝත්පාදනය (Forever Innovating)
6. පැතලි බව (Flat)
7. පිරිමැසුම් බව (Frugal)
8. මිත්‍රශීලී බව (Friendly)
9. තෘප්තිමත් බව (Fun)



සඳකැලුම් ජයතුංග,
ගණකාධිකාරි,
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්.





HNB ග්‍රාමින් ෆිනෑන්ස් ලිමිටඩ් හි කඩුවෙල ශාඛාවේ ශාඛා කළමනාකරු වූ කාංචන රංග ගුණසේකර මහතා සෙරන්දි හංසිකා මෙනෙවිය සමඟ නව යුගදිවි ගමන් ඇරඹුවේ පසුගිය අගෝස්තු 24 වෙනිදාය.

HNB ග්‍රාමින් ෆිනෑන්ස් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු සහකාර කළමනාකරු ඔකඳ ජයසිංහ මහතා ඉෂාන්ති කුරේ මෙනෙවිය සමඟ වෙන්නප්පුවෙ ද සියෝන් හෝටලයෙදී නව යුගදිවි ගමන් ඇරඹුවේ පසුගිය සැප්තැම්බර් 07 වෙනිදාට යෙදුණු සුබ මොහොතිනි.



## සුබ මංගලම්



මිනුවන්ගොඩ ලක්නාරා උත්සව ශාලාවේදී සැප්තැම්බර් 01 දින උඩරට සිරිතට අනුව සිය විවාහ මංගලෝත්සවය පැවැත්වූ HNB ග්‍රාමින් ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් අංශයේ ජ්‍යේෂ්ඨ කළමනාකරුවකු ලෙස සේවයේ නියුතු යොහාන් ධනංජය මහතාගේ අත ගත් මනාලිය වූයේ තරුෂි ලියනගේ මෙනෙවියය.

ඔබ සැමගේ සුන්දර යුගදිවියට
HNB ග්‍රාමින් ෆිනෑන්ස් ලිමිටඩ්හි
සහෝදර නිළධාරි
මඬුල්ලේ සුභාශිංෂණ ඔබ සැමට
අපි මෙසේ පිළිගන්වමු...

**අනුන්ගේ දියුණුව දැක සතුටු වීමෙන් තමාද දියුණුවට පත්වේ.**

# අතීතය මගෙන් උදුරගත් දේ යළි හිමිකරගැන්ම මගේ අරමුණයි...


උදයසිරි රත්නායක
කළමනාකරු - මොණරාගල ශාඛාව

HNB ග්‍රාමීන් සමාගමේ මොනරාගල ශාඛාවේ කළමනාකරු වූ උදයසිරි රත්නායක මහතා කැළණිය විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන ශාස්ත්‍රවේදී (B.A.) උපාධිය හිමි කරගැනීමට පසුගියදා සමත් වුණා. ජීවිතයේ තවත් එක් ජයග්‍රාහී කඩ ඉමක උණුසුම අත්විඳින අතරතුර මේ පිළිබඳව මෙහෙවර කළ විමසීමකට ඔහු පිළිවදන් දුන්නේ මෙසේයි.

"මම උසස්පෙළට කළේ වානිජ විෂයන්. ඒත් විශ්ව විද්‍යාල ප්‍රවේශයට ලබා ගත් ලකුණු ප්‍රමාණවත් වුනේ නෑ. දෙවෙනි පාරත් විභාගයට පෙනී ඉදලා මම හිතුවා රස්සාවක් හොයා ගන්න. මොකද ඒ වෙද්දි තාත්තා නැතිවෙලා පවුලෙ බරට උර දුන්නේ මගේ ලොකු අයියා. එයාට බරක් නොවී රස්සාවක් කරන්න මම හිතුවා ආයතන කිහිපයකම රස්සාවල් කීපයක්ම කළා. ඒ අතරෙ Chartered Exam පළවෙනි එකත් පාස්වුණා. ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුනේ 2005 දී. අම්පාර ශාඛාවේ ගිණුම් සහයකයෙක් විදිහට. අම්පාරෙ Chartered කරන්න පහසුකම් නොතිබුණු නිසා ඊළග කොටස කරන්න මට ලැබුණෙ නෑ. ඔය අතරෙ තමයි මම කැලණිය විශ්ව විද්‍යාලයෙ බාහිර ශිෂ්‍යයෙක් විදිහට ලියාපදිංචි වුණේ. කලා විෂයයන් වලින් උපාධිය සම්පූර්ණ කළා. ඒකේ උපාධි ප්‍රදානය කෙරුණේ මීට මාස දෙකතුනකට උඩදි. මාස 6ක් විතර ගම්පහ ප්‍රාදේශිකයේ මූල්‍ය සහ අනුකූලතා කළමනාකරු විදිහට කටයුතු කරලා පහුගිය ජූලි මාසෙ ඉඳන් මොනරාගල ශාඛාවේ කළමනාකරු විදිහට පත්වීම ලැබුවා. 2017 ජීවිතේ සංධිස්ථානයක් සනිටුහන් කරපු අවුරුද්දක් කියලයි මට හිතෙන්නෙ. ඉදිරියේදී කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා එකක් කරන්න හිතා ඉන්නවා.

ජය මගක සළකුණු

## ශානක... SLIM ඩිප්ලෝමා ලබයි...


ශානක රූපසිංහ
ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක - ප්‍රධාන කාර්යාලය

HNB ග්‍රාමීන් සමාගමේ ස්ථාවර තැන්පතු අංශයේ සේවයේ නියුතු ජී. ජී. එම්. ශානක රූපසිංහ මහතා ශ්‍රී ලංකා අළෙවිකරුවන්ගේ සංගමය(SLIM) මගින් පවත්වනු ලබන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් වූ අළෙවි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව 2016/17 (National Diploma in Sales Management) සමත් වී ඇති අතර ලද ජයග්‍රහනය සම්බන්ධයෙන් HNB ග්‍රාමීන් පවුලේ සුභාෂිංශන අපි මෙසේ පිළිගන්වමු.

## සත්කාර අරමුදලින් පිළිසරණ ලැබූවෝ...

මිනිසුන් අසරණ වන්නේ කොයි මොහොතක කෙසේදැයි අප කාහට නම් කිව හැකිද...එවන් මොහොතක ඒ අසරණ මිනිසුන්හට කිසියම් හෝ අන්දමකින් සරණ විය හැකිනම්....මෙහෙවර සත්කාර අරමුදල බිහිවන්නේ එවන් උදාර අරමුණක් පෙරදැරිවය.

HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබගේම ධන පරිත්‍යාගයෙන් ගොඩනැගුණු "මෙහෙවර" සත්කාර අරමුදලේ පිහිට පතමින් දිවයිනේ දසතින් අපවෙත ලැබෙන ඉල්ලීම් සිය ගණනක් අතරින් තෝරාගත් පිළිසරණ අපේක්ෂකයින් කිහිපදෙනෙකුට පසුගියදා අපි ආධාර මුදල් ලබාදීමට කටයුතු කළෙමු. එසේ මේ වනවිටත් ආධාර ලබාදී ඇති ආධාර ලාභීන් කිහිප දෙනකු පිළිබඳ තොරතුරු මෙසේය.



බණ්ඩාරවෙල ශාඛාව
සාමාජිකාව:- ඩී. සන්ධ්‍යාදේවී
ආධාර ලාභියා:- එස්. ලක්ෂිකා (දුව)
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා



බණ්ඩාරවෙල ශාඛාව
සාමාජිකාව:- ඊ.එම්.එම්.පී. චමරි
ආධාර ලාභියා:- ආර්.එම්.ඒ.ඩී. බණ්ඩාර (පුතා)
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා



බණ්ඩාරවෙල ශාඛාව
සාමාජිකාව:- කේ.සරෝජා
ආධාර ලාභියා:- එම්. සුරේෂ් (පුතා)
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**HNB ග්‍රාමීන් සමාගම තම කාර්ය මණ්ඩලයේ සහ ගනුදෙනුකාර භවතුන්ගේ අභිවෘද්ධිය සහ ශක්‍යතාවන් ඉහළ තලයක් කරා ඔසවා තැබීමට නිරතුරුව වෙහෙසෙන සමාගමකි. මෙම අරමුණ ඇතිව ස්ථාපිත කර ඇති පුහුණු අංශය මගින් මෙම වසරේ පසුගිය ජූලි මාසය තුළ සංවිධානය කර මෙහෙයවන ලද වැඩමුළු ගණනාවක් අතරින් පහත සඳහන් වැඩමුළු පිළිබඳ තොරතුරු අපවෙත ලැබී තිබුණා.**





මහනුවර ශාඛාවෙහි සාමාජිකාවන් 160 දෙනකු හට මුදල් පරිපාලනය සහ ඉතුරුම් වර්ධනය කරගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2017/07/28 දින රෝයල් කැන්ඩියන් හෝටල් පරිශ්‍රයේදී අනුර උඩවත්ත මහතාගේ මෙහෙයවීම යටතේ පවත්වන ලදි.



හලාවත ශාඛාවෙහි සාමාජිකාවන් 121 දෙනකු හට මුදල් පරිපාලනය සහ ඉතුරුම් වර්ධනය කරගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2017/07/20 දින ක්‍රවුන් උත්සව ශාලාවේදී අනුර උඩවත්ත මහතාගේ මෙහෙයවීම යටතේ පවත්වන ලදි.



කන්තලේ හා ත්‍රිකුණාමලය ශාඛාවන්හි සිංහල මාධ්‍ය නිලධාරීන් 30 සදහා පෞරුෂත්ව,ආකල්ප හා නායකත්ව පුහුණු වැඩසටහනක් 2017/07/15 දින ත්‍රිකුණාමලය සර්වෝදය ශාලාවේ සහ ත්‍රිකුණාමලය මුහුදු තීරය ආශ්‍රිතව පවත්වන ලදි.

HNB ග්‍රාමීන් ශාඛාවක වගතුග

# ගැටළුව තේරුම් ගෙන ඊට පිළියම් යෙදීම අපේ ජයග්‍රහනයේ රහසයි...



HNB ග්‍රාමීන් මන්නාරම ශාඛාව

සටහන - මංජුල ප්‍රභාත් /සේයා රූ - ලක්ෂ්මන්


ජෝෂප් ජෝන්
ජ්‍යෙෂ්ඨ
ප්‍රාදේශීය කළමනාකරු


එස්. රොෂාන්
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
මූල්‍ය/අනුකූලතා


පිලිප් හෝමර්
ශාඛා කළමනාකරු


රෙජිනෝල්ඩ් අරුල්දාස්
සහකාර කළමනාකරු


ඇන්ටන් නිශාන්තන්
ජ්‍යෙෂ්ඨ විධායක
ගිණුම් හා පරිපාලන


කුමාර් දර්ශන්
කණිෂ්ඨ සහකාර කළමනාකරු
ක්ෂුද්‍ර මූල්‍ය


ටී. සෙන්දුරන්
ප්‍රාදේශීය තොරතුරු
සන්නිවේදන විධායක


“ කුඹුරු ගොවිතැන ඇරුණහම වැඩි කොටසක් නිරතවෙලා ඉන්නේ ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියාවල ඉතා සුළු පිරිසක් තමයි... වෙනත් ව්‍යාපාරවල නිරත වෙලා ඉන්නේ...”

**මේ** පාර මෙහෙවර ශාඛාවක වගතුග සොයා යන ගමනට මන්නාරම ශාඛාව තෝරාගත් මොහොතේ සිට මගේ සිතේ නින්නාද වුණු ගීතය වුයේ ෆ්‍රෙඩී සිල්වා මහතා ගායනා කරන ‘‘මන්නාරම් පිටි වැල්ලේ මදටිය වැල් ඔංචිල්ලේ’’ යනුවෙන් ඇරඹෙන අතිශය සුන්දර ප්‍රේම විරහාලාපයයි. මෙතෙක් කිසිදා ඇස නොගැසුණු මන්නාරම් පිටි වැල්ලද, ළුණු පාත්ති වලට වතුර දමා විඩාපත්වුණු කුණ්ඩුමනිලාද දකින්නට අපේ සිත් නොඉවසිලිමත්වී ඇත. සැතපුම් ගණනාවක් දුර ගෙවා ඉදිරියට ඇදෙන අපේ නෙතු මානයට එතෙක් හුරු පුරුදු වු කොළ පැහැති පරිසරය ක්‍රමයෙන් දුරස් වෙමින් යමින් තිබේ. ඒ වෙනුවට බොහෝ දුරට විහිදී යන රන්වන් පැහැ වැලි තලාව හා ජලය සිදුණු කලපු පතුල සහිත පරිසරයක දැඩි හිරු රශ්මිය දෑස් කෙවෙනි වලට කටු ඇන්නද සැතපුම් ගණනක් දුරට විහිදුණු පිටි වැල්ල නෙතු මානයේ මවන දර්ශනය අතිශය සුන්දර වුවකි.

HNB ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවේ 47 වන ශාඛාව වු මන්නාරම් ශාඛාව ආරම්භක දිනය ලෙස සටහන් වන්නේ 2004 දෙසැම්බර් 14 වනදාය. මිට වසර 13 කට පෙරාතුව ආරම්භ වුණු HNB ග්‍රාමීන් මන්නාරම් ශාඛාවේ වගතුග විමසුවේ ජෝශප් ජෝන් මහතාගෙනි. වර්තමානයෙහි යාපනය ප්‍රාදේශිකය භාර ප්‍රාදේශිය කළමනාකරුවු ඔහු මීට වසර 14 කට පෙර මන්නාරම ශාඛාව ආරම්භ කරන අවදියේදී වවුනියාව ශාඛාවේ ක්ෂේත්‍ර කළමනාකරු ලෙස කටයුතු කරමින් සිටියේය.

"මම වවුනියාවේ වැඩ කරමින් ඉන්දැද්දි හෙඩ් ඔෆිස් එකෙන් කිව්වා මන්නාරමේ ශාඛාවක් ආරම්භ කරන්න සැලසුම් කරලා තියෙනවා ශාඛාවක් පටන් ගන්න තැනක් බලලා මධ්‍යස්ථාන පටන් ගන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. ඒ වෙද්දි මම ග්‍රාමීන් එකට බැඳිලා අවුරුදු  දෙකයි. ඒ අත්දැකීම උඩ මේ වගකිම මම සතුටින් භාරගත්තා. වවුනියාවේ ඉඳලා මම මන්නාරමට බස් එකේ ඇවිත් මන්නාරමට පත් කරලා එවලා තිබුණු ක්ෂේත්‍ර කළමනාකරුත් එක්ක ඔහුගේ බයිසිකලේ අපි මධ්‍යස්ථාන බලන්න ගියා. ඒ වෙද්දි අද වගේ ක්ෂුද්‍ර මුල්‍ය සමාගම් වැහි වැහැලා තිබුනෙ නැහැ. මිනිස්සුත් අපේ ක්‍රමය ගැන දැනගත්තම  ඉතා කැමැත්තෙන් අප වටා ඒකරාශි වුනා.

2005 වෙද්දි අපි මන්නාරම ශාඛාව ආරම්භ කරලා ණය නිකුත් කරන්න පටන් ගත්තා. ශාඛාව පිහිටුවලා තිබුනෙ සින්නකඩ රෝඩ් වල.

මන්නාරම දිස්ත්‍රික්කයක් සේම අනිත් අතින් හතර වටින්ම මුහුදින් වටවු දුපතකි. ද්‍රවිඩ මුස්ලිම් ජනවර්ග දෙක 70% - 30% ආසන්නවු අනුපාතයට  ජීවත් වන මෙහි ජිවත්වන්නන්ගෙන් බහුතරයක් කෘෂිකර්මය ආශ්‍රය කරගත් ජිවනෝපායන්හි නිරතව සිටින්නෝය.

කුඹුරු ගොවිතැන ඇරුණහම වැඩි කොටසක් නිරතවෙලා ඉන්නේ ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියාවල.  ඉතා සුළු පිරිසක් තමයි වෙනත් ව්‍යාපාරවල නිරත වෙලා ඉන්නේ. මේ මුළු ප්‍රදේශයම ආවරණය වෙන විදියට අපේ මධ්‍යස්ථාන පිහිටුවලා තියෙනවා. මන්නාරමේ ඉඳලා කොළඹ පැත්තට කි.මී.40 විතර දුරට යනවා මඩු පල්ලිය ආසන්නයට වෙනකම් . අනික් පැත්තෙන් තලේමන්නාරමටත් යාපනය පැත්තෙන් පාලියාර් වෙනකම් අපේ මධ්‍යස්ථාන පිහිටුවලා තියෙනවා.

HNB ග්‍රාමීන් සමාගමට පස්සේ පිහිටුවනු ලැබු වෙනත් මුල්‍ය ආයතන ගණනාවක් මේ වෙනකොට මන්නාරමේ තිබුනත් එදා අපිට තිබුණු ජනතා ප්‍රසාදය අද වෙනතුරුත් ඒ ලෙසටම රඳවා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ අපි අපේ ගනුදෙනුකරුවන් වෙත ලබාදී තිබෙන සේවාව නිසයි. හිතවත්කම සහ විශ්වාසය පදනම් කරගත් අපේ පාරිභෝගික සේවාවට 4771 ක් වු අපේ සාමාජිකත්වය එදා වගේම අදටත් ගරු කරනවා."

2016/2017 වාර්ෂික ප්‍රගති සමාලෝචන හමුවේදි වසරේ වඩාත් බලාපොරොත්තු තැබිය හැකි ශාඛාවට හිමි සම්මානය දිනා ගනු ලැබුවේ මන්නාරම ශාඛාවය. ස්වභාවික හෝ වෙනත් වළකාලිය නොහැකි හේතු මත යම් පසුබෑමකට ලක්වු එහෙත් කෙටි කාලයක් තුළ එම අභියෝගය ජයගත් ශාඛාව මෙහිදි ඇගැයිමට ලක්වේ. මන්නාරම ශාඛාව එම අභියෝගය ජයගත් ආකාරය පිළිබඳව ශාඛා කළමනාකරු පිලිප් හෝමර් මහතා මෙසේ අප සමඟ සිය අදහස් දැක්විය.

"මෙහෙ හොඳට බිස්නස් තියෙන්නේ අප්‍රේල් සිට ඔක්තෝබර් දක්වා මාස වල. ඒ කාලෙට මෙහේ මිනිස්සු හොඳට හම්බ කරනවා. ඒ වාගේම රත්තරං බඩු ගන්නවා. ඉන්පස්සේ බිස්නස් සවුත්තු කාල වලදි ඒ රත්තරං බඩු බැංකුවේ උකස් කරලා ජීවත් වෙන්න තමයි පුරුදු වෙලා තිබෙන්නේ. එතකොට අපි දුන්නු ණය නැවත අය කිරීමේ ගැටළුවකටත් ඔය කාලෙදි අපි මුහුණ දෙනවා. ඒක අපේ ශාඛාවට සෘජුවම බලපාන්නක්. මෙන්න මේ තත්වයට අපි එකතු වෙලා විසඳුම් හෙව්වා. අපි කලේ ඔවුන් එතෙක් පුරුදු වෙලා හිටිය විදිහ වෙනස් කරලා ඔවුන් මුදල් උපයන කාල වලදි ඒ සල්ලි ඉතිරි කරන්න පුරුදු කළා. ඉන්පස්සේ මුදල් හිඟ කාල වලදි ඒ ඉතුරුම් වලින් ජිවත් වෙන්න ඔවුන්ට පුළුවන් වුණා.  ඒ වගේම ඒ කාලවලදි ඔවුන්ට කළ හැකි වෙනත් ව්‍යාපාර හඳුන්වා දීම තුළින් අතිරේක ආදායම් මාර්ග සලස්වාලීමටත් අපි පියවර ගත්තා.

මේ ක්‍රමයෙන් වඩා හොඳ ජිවන රටාවකට යොමු වෙන්න අපේ ගනුදෙනු කරුවන්ට හැකිවුණා විතරක් නෙවෙයි අපේ ශාඛාව එතෙක් මුහුණු දුන්න අර්බුදයෙන් මුදවා ගන්න අපට පුලුවන් වුණා." හෝමර්ගේ මුහුණෙහි  රැඳී ඇති ජයග්‍රාහී සිනහව පවසනුයේ බොහෝ දුෂ්කර වෑයමක අවසන් ප්‍රතිඵලයෙහි කතාවය. ඒ හසරැල් මතින් උපදින හෙට දවසට අපේ සුපැතුම් එක්කරමින් දවස මියැදෙන සවසක අපි මන්නාරම ශාඛාවට සමුදී නැවත කොළඹ බලා ඒමට පිටත් වුනෙමු.


HNB ග්‍රාමීන් මන්නාරම ශාඛාවේ කාර්ය මණ්ඩලය

අපට අවශ්‍ය පුද්ගලයා තව කෙනෙකු තුළින් දැකිය නොහැක.

ඔබ (NO)දන්න මම



# ජීවිතේ අරමුණු ජයගන්න වයස හෝ වගකීම් බාධාවක් නොවේ...

චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරී

**ජීවිත කාලය හා සසදන කළ වසර හයක් යනු ඉතා කෙටි කාල පරාසයකි. එහෙත් ආයතනයක් සම්බන්ධයෙන් ගත්විට එය දිගු කාලයකි. HNB Grameen සමාගම මෙයට වසර හයකට පෙර තිබූ තත්වය සහ එහි වර්තමානය විමසද්දි ගතවුණු වසර හයක කාලය ග්‍රාමීන් ආයතනයට කෙබදු තීරණාත්මක කාලපරිච්ජේදයක් වීද යන්න අමුතුවෙන් පැවසිය යුතු නොවේ. ආයතනයේ මෙම පරිවර්තනීය කාලය පුරාම එහි තීරක බලධරයාව ක්‍රියාකළ චමින්ද ප්‍රභාත් මහතා කිසිසේත් ඔබට මට අමුත්තෙකු නොවේ.මෙවන් සුවිශාල වගකීමක් උසුලමින් ඊට නිසි නායකත්වය ලබාදෙන්නට එදාමෙදාතුර ජීවිතයේ ඔහු ලද ජීවන අත්දැකීම් කොතෙක් නම් මහෝපකාරී වන්නට ඇද්ද. HNB Grameen කළමනාකාර අධ්‍යක්ෂවරයා හෝ ප්‍රධාන විධායක නිළධාරියා ලෙස ඔබ දැන සිටි ඔහුගේ ඔබ (නො)දැන සිටි ජීවිතය “ඔබ (නො)දන්න මං” විශේෂාංගයට ගොනු කරන්නට අප උත්සාහ ගත්තේ එම ජීවන අත්දැකීම් අපගේ ජීවන ගමන් මගටද බොහෝ පූර්වාදර්ශ සපයන**

**සම්පූර්ණ නම ෘ-** බමුණු අච්චිමංගෙදරගේ දොන් චමින්ද ප්‍රභාත්

**උපන් දිනය (කැමති නම්) ෘ-** 1971.12.18

**ඔබේ ළමා කාලය ගෙවීගිය අයුරු පිළිබඳව සඳහන් කළොත් ෘ-**

මගේ ගම හෝමාගම. අද හුගක් ජනාකීර්ණ වුණත් අපි පුංචි කාලේ ඒ පළාත ග්‍රාමීයයි. හෝමාගමිනුත් කිලෝ මීටරයක් එකහමාරක් ඇතුළට වෙන්න අපේ ගෙවල් තිබුණෙ. මගේ තාත්තා හමුදා නිළධාරියෙක්. අම්මා ගෙදර වැඩපළට අමතරව ඉඩ කඩ ලැබෙන විදිහට ඇඳුම් මැසීම ස්වයං රැකියාවක් විදිහට කළා. අපේ පවුලෙ මල්ලියි මමයි. මේ පසුබිම තුළයි මගේ පුංචි කාලේ ගෙවුණෙ. අපේ ගෙවල් වටේම හිටිය වැඩිදෙනෙක් අපේ නෑදෑයො. ඒ හැම පවුලකම වගේ අපේ වයසෙ ළමයි හිටියෙ. ඉතින් හොඳට කෙළිදෙලෙන් ගත කරන්නට පුළුවන් ළමා කාලයක් මට හිමිවුණා. ඒ කාලේ අධ්‍යාපනය ගැන නෙවෙයි ඔලුවෙ තිබුණෙ. කට්ටියත් එක්ක එකතුවෙලා කරන වැඩ ගැන. අපේ ගෙවල් වලට ටිකක් එහායින් වෙළක් අද්දරට වෙන්න තිබුණා පොදු ළිඳක් කවුරුවත් නැති වෙලාවල් බලලා අපි ඕකට නාන්න ගියා.නාන්නේ ළිඳට බැහැලා. අපි නෑවට පස්සේ ළිඳ බොරවෙලා ආයි කාටවත් නාන්න බැරි තරමට. කාලයක්ම අපි මේ වැඩේ හොරෙන් කරගෙන ගියා. අද දරුවන්ට උරුම නැති මේ වගේ සුන්දර දේවල් වලින් අපේ ළමා කාලය පිරිලා තිබුණා.

**පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල වුනේ ෘ-**

මම මුලින්ම ගියේ හෝමාගම කණිෂ්ඨ විද්‍යාලයට. අපේ ගෙදර ඉඳන් ගෙවල් දෙකතුනකට එහා ඉස්කෝලේ.3 පංතියේ ඉඳලා තාත්තා මාව කොළඹ තර්ස්ටන් විද්‍යාලයට ඇතුලත් කළා. උසස් පෙළට වෙනකම් මම ගියේ තර්ස්ටන් එකට.මගේ පාසැල් ජීවිතෙන් වැඩිම කාලයක් ගෙවුණොත් මගේ ජීවිතේ මුළුමණින්ම වගෙ වෙනස් කළෙත් තර්ස්ටන් විද්‍යාලය . ඒ නිසා මගේ ප්‍රියතම පාසැල තර්ස්ටන් එක කිව්වොත් නිවැරදියි.

**විෂය ෘ-**

පහ හය පංතිවලට එනකම් කවුරු හරි මගෙන් ඇහුව නම් අප්‍රියම විෂය මොකක්ද කියලා ගණිතය කියලා මම පිළිතුරු දේවි. වාර විභාග වලදි මගේ ලකුණු අඩුම විෂය වුණේ ගණිතය. මේ තත්වය වෙනස් වෙලා මම ගණිතයට ප්‍රිය ශිෂ්‍යයෙක් බවට පත්වෙන්නේ හයේ පන්තියේදී මගේ යාළුවෙක්ගේ අයියා කෙනෙක්ගෙන් ගණිතය ඉගෙන ගන්න පටන් ගත්තට පස්සෙ. ඔහු මට ඉතා සරලව ගණිතය ඉගැන්නුවා.මට ඒක රසවත් විෂයක්ය කියලා



මුලින්ම දැනෙන්න සැලැස්සුවෙ ඔහු. ඉන් පස්සෙ කොට්ටාවෙ මොරකැටියෙ පවත්වාගෙන ගිය නාලන්දා ඉන්සිටියුට් එක මගේ ජීවිතයෙ තවත් එක් සංධිස්ථානයක්. ඒකේ ගණිතය උගන්වපු බුලත්සිංහල සර්ගේ ඉගැන්වීමේ රටාවත් එක්ක ඉතා ඉක්මණින් ගණිතය මගේ ප්‍රියතම විෂය බවට පත්වුණා. අන්තිමට මම උසස්පෙළට තෝරා ගත්තෙ ගණිතය විෂයන්

**ක්‍රීඩාව ෘ-**

ඉස්කෝලෙ හත අට පංතිවලට එනකම් මම හැම ක්‍රීඩාවක්ම වගේ කළා. ක්‍රිකට්,වොලිබෝල්,තුන් පිම්ම,යගුලිය,කවපෙත්ත වගේ ඉසව් ගණනාවක්.ඒත් ඉන්පස්සෙ මම වැඩි අවධානයක් යොමු කළේ ඉගෙනීමට. මට දැණුනා මම කොහොම හරි මහන්සි වෙලා ඉගෙන ගන්න ඕන කියලා.මොකද මට තේරෙන්න ගත්තා මට අනාගතයක් තියෙන්නෙ ඉගෙන ගත්තොත් විතරයි කියලා. මේ නිසා ක්‍රීඩා පැත්තට තිබුණු මගේ අවධානය කාලයත් එක්ක ක්‍රමයෙන් අඩුවෙන්න ගත්තා.කරපු ක්‍රීඩාවන් අතරින් මම ක්‍රිකට් වලට වඩාත් කැමැතියි. විශේෂයෙන් පන්දු යවන්නෙක් විදිහට ක්‍රීඩා සමාජ මට්ටමෙන් මම දස්කම් දැක්වූවා.

**ජීවිතයට වටිනාකම් එකතු කර ගැනීම සඳහා ඔබ කළ කැපකිරීම් ෘ-**

මම උසස් පෙළට ගණිතය අංශයෙන් පෙනී හිටලා විශ්ව විද්‍යාලයට ඇතුලත්වීම සඳහා පරිසාධිත මට්ටමට වඩා ලකුණු ගත්තා. ඒත් රසායන විද්‍යාවට අරන් තිබුණේ ඉතා අඩු ලකුණු ප්‍රමාණයක්. මට කැම්පස් යන්න අවශ්‍ය ලකුණු තිබුණත් රසායන විද්‍යාවට තිබුණු අඩු ලකුණු ප්‍රමාණය නිසා කැම්පස් එකට තේරුණේ නෑ. දෙවෙනි පාර මම උත්සාහ කළත් කලින් පාර තරම් මහන්සි වුණේ නෑ. ඒ නිසා පළවෙනි පාර තරම් හොඳ ප්‍රතිඵලයක් ගන්න පුළුවන් වුණේ නෑ. ඒ අසමත් වීම මා තුළ ඇති කළේ තව දුරටත් ඉගෙන ගන්න ඕන කියන දැඩි අධිෂ්ඨානයයි., මම Chartered Accountancy කරන්න පටන් ගත්තේ ඒ සිතුවිල්ලෙන්. ඒකේ පළවෙනි විභාගය ඉහළින්ම සමත්වුණා. ඒ කාලෙම එංගලන්තයේ Chartered Institute of Management Accountants(CIMA) විභාගය කරන්නත් පටන් ගත්තා. මේ විදිහට අධ්‍යාපනයේ විවිධ කඩඉම් ජයගනිමින් ඉදිරියටම ගියත් මට මුදල් ප්‍රශ්න නිසා CIMA සම්පූර්ණ කරගන්න බැරි වුණා. 1997 ඉඳලා 2001 වෙනකල් මම අධ්‍යාපනයෙන් ඈත්වෙලා රැකියාව විතරක් කරගෙන හිටියා. මට හිතුණා මේ එකම විෂය පරාසයක හිරවෙලා ඉන්න එකෙන් මිදිලා වෙනත් විෂය ක්ෂේත්‍රයකට යොමු වෙන්න. මම හිතුවා



පරිඝනක පැත්ත දිග දුරට හදාරන්න. NIIT එකේ පරිඝනක මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව අවුරුදු තුනක් හදාරලා ඒ ඩිප්ලෝමා එක සමත් වුණා.එදා පරිඝනක විද්‍යාව ගැන ලබපු දැනුමේ වටිනාකම අදමට ඉතා වැදගත් වුණත් ඒ දවස්වල මගේ වෘත්තීයමය සුදුසුකම් වලට ඒක ඒ තරම් බලපෑමක් කරන්නෙ නෑ කියලා මට තේරුණා. ඇත්තටම ඒක මගේ සංක්‍රාන්ති කාලයක් කිව්වත් හරි. මම යායුතු මාර්ගය මොකක්ද කියලා මම සොයමින් හිටිය යුගය ඒ.මට තේරුණා මම එක අරමුණකට යා යුතුයි කියලා. ඒ ගමන තමයි වඩාත් ජව සම්පන්නව මම කටයුතු කරන්න පටන් ගත්තේ. ඒ 2005 අවුරුද්ද. ඔය අතරෙ තමයි මම ආපහු ගණකාධිකරණය පැත්තට යොමුවුණේ. ඒක අහම්බයක් වුණත් මම හිතන්නේ මගේ ජීවිතේ ප්‍රධානතම හැරවුම් ලක්ෂ්‍යය ඒක කියලයි. ඒ ගමන චාටඩ් ඉන්සිටියුට් එකේ ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා එක කරලා ඒක ඉහළින්ම සමත්වුණා. ඕස්ට්‍රේලියාවේ Southern Queensland විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පිළිබඳ පශ්චාත් උපාධිය හැදෑරුවෙත් මේ කාලෙමයි.

ඒ එක්කම ඊළඟට ඕස්ට්‍රේලියාවේ institute of Certified Management Accountants ආයතනයෙන් Certified Management Accountant කියන වෘත්තීය සඳුසුකම ලබාගත්තා. ග්‍රාමින් සමාගමට සම්බන්ධ වුණාට පස්සෙ ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ දිග දුරට හදාරන්න මට අවශ්‍ය වුණා.මොකද මට හිතුණා Micro Finance ගැන මනා දැනුමක් තිබීම වැදගත් කියලා ඒ අනුව ජර්මනියේ Frankfurt School of Finance and Management මගින් මෙහෙයවනු ලබන Internationally Certified Micro Finance Expert සහතිකය ලබාගත් ලංකාවේ දෙතුන් දෙනා අතරට මමත් එක්වුණා. එංගලන්තයේ වරලත් අළෙවිකරුවන්ගේ ආයතනයේ (CIM) සාමාජිකත්වය ලබාගන්න මේ කාලය තුළ මට පුළුවන් වුණා. මේ විදිහට බොහෝ කැපවීමෙන් ජීවිතයට අලුතින් වටිනාකම් රැසක් එකතුකරගත්තත් CIMA එක ඉවරකරගන්න බැරිවීම ගැන ළතැවිල්ලක් හිතේ තිබුණා.ඒත් මේ ඒකට කාලය නෙවෙයි කියලයි මට හිතුණේ. විශේෂයෙන් තිබුණු අධික කාර්ය බහුලත්වයත් වයස පිළිබඳ හැඟීමත් ඒකට බලපෑවා. මේ ළතැවිල්ල අධිෂ්ඨානයක් බවට පෙරළුවෙ අපේ ආයතනයේ පද්මසිරි දයාවංශ සහ හර්ෂණ කුලතිලක මහත්වරුන්ගේ නිරන්තර දිරිදීම. ඒ පෙළඹවීම මත මම CIMA අවසන් කළේ මේ මෑතකදි. ඒ සඳහා මම පංතිවලට සහභාගී වෙද්දි ඒ පංතිවල හිටියේ අවුරුදු 20 21 තරුණ පිරිස්.වයස 46 ක්වුණු මම ඔවුන් එක්ක එක පංතියේ එකට ඉගෙන ගත්තා ... විශේෂයෙන් මෙහි ඇති තරගකාරී බව සහ දැනුම යාවත්කාලීන කරගැනීමේ අවශ්‍යතාවය නිසා ඒ සඳහා කැපකිරීම් කළයුතුම වෙනවා. ඇත්තටම ඒක ජීවිතේ සුන්දර අත්දැකීමක්. මම මගේ අධ්‍යාපන කටයුතුවල වැඩිපුරම නියැළුනේ රැකියාව කරන ගමන්. සැමියෙකුගෙ පියෙකුගෙ වගකීම් උසුලමින් ඉතාම අවිවේකී ජීවිතයක් ගෙවන ගමන්...මට කියන්න ඕන ඉගෙන ගන්න වයස බලපාන්නෙ නෑ කියන එකයි. ඒ වගේමයි ඉගෙන ගන්න හැමදේම අවසානයේ ජීවිතයට එකතු කරන්නෙ අමිල වටිනාකම්



**ආගම හැරුණු විට ඔබ වඩාත් ගෞරවනීයව සලකන්නේ ඃ-**
එහෙම දේවල් හතරක් මගේ ජීවිතයේ තියෙනවා. මම වඩාත් ගෞරවනීයව සලකන. එක මාව හදාවඩලා මාව මේ තත්වෙට ගේන්න ඇපකැප වුණු මගේ ආදරණීය අම්මයි තාත්තයි. දෙවැන්න මම ඉගෙන ගත්තු පාසැල. තුන්වෙනියට මම එදා ඉඳලා අද දක්වා රැකියා කරපු සහ කරන රැකියා ස්ථාන සියල්ලම මගේ ආදරය ගෞරවය දිනාගන්නවා. සිව්වැන්න මගේ බිරිඳ සහ දරුවන්. මේ හතර මත තමයි මගේ ප්‍රතිපත්ති තීරණය වෙන්නෙ. ඒ වගේම කවදාවත් මේ අයට සහ ස්ථානයන්ට අගෞරවයක් වෙන දෙයක් මගේ අතින් වෙන්නේ නෑ.

**පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ ඃ-**
කවදහරි ඉංජිනේරුවෙක් වෙන්න මට හීනයක් තිබුණා. මම ගණිත අංශය තෝරා ගත්තෙත් ඒ නිසා. ඒත් මම නැවතුනේ මෙතැන. ජීවිතේ හැම දේකටම හේතුවක් තියෙනවා. ඒ හේතුවට අනුව ජීවිතේ දේවල් තීරණය වෙනවා.හැරිලා බලන්න ඔබේ ජීවිතය මේ තැනට එන්න බලපාපු සිද්ධි දාමය දිහා. ඒ හැම එකක්ම එකකට එකක් සම්බන්ධයි

**මුල්ම රැකියාව සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව ඃ-**
මම මුලින්ම ගියේ කේ.පී.එම්.ජී. සමාගමේ රැකියාවකට. ඒකේ අවුරුදු තුනක් විතර රැකියාව කළා.ග්‍රෝත් ලංකා සමාගමේ අවුරුදු නවයක්. නෝර්ත් සේල් කියන ජාත්‍යන්තර සමාගමේ අවුරුදු හතරක්. ඊළඟට තමයි ප්‍රයිම් ලෑන්ඩ් සමාගමට සම්බන්ධ වෙන්නේ. මේ හැම සමාගමකින්ම එකකට එකක් වෙනස් අත්දැකීම් ලැබුණා. ඒ වගේම වැඩ කරන හැම තැනකදිම මට පැවරුණු කාර්යයට සහ ආයතනයට ආදරෙන් මම වැඩ කළා. ඒනිසා මම ඒ සෑම රැකියාවකටම කැමතියි.

**ජීවිතේ අමතක නොවන සිද්ධිය ඃ-**
මගේ බිරිඳ සඳමිණිව මුලින්ම හම්බ වුණු දවස

**ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය ඃ-**
ජීවිතේ හුගක්ම සතුටට පත්වුණු දවස් දෙකක් තියෙනවා. මගේ පුතාලා දෙන්නා හම්බ වුණු දවස් දෙක. ලොකු පුතා ලැබෙද්දි මට ළඟ ඉන්න ලැබුනෙ නෑ. ඒත් දෙවෙනියා ලැබෙද්දි මම ළඟ හිටියා. ජීවිතේ වැඩියෙන්ම දුකක් දැණුනෙ තාත්තගෙ අයියා මගෙ මහප්පා නැතිවුණු දවසෙ. එයා බැඳලා



හිටියෙ නෑ. වැඩිපුරම ගත කළේ පිටරට. මේ නිසාම ලෝකය පිළිබඳ පුළුල් දැනුමක් සහ දැක්මක් ඔහුට තිබුණා. ජීවිතය දිහා වෙනස් විදිහට දකින්න අපිව පෙළඹුවේ ඔහු. ඒ ඇසුර නැතිවීම ගැන අදටත් මට දැනෙන්නෙ දුකක්.

**හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා ඃ-**
මට එහෙම දැනිච්ච හුගක් දේවල් මම හරිගස්සගෙන තියෙනවා.....විශේෂයෙන් කවුරුහරි මගේ අඩුපාඩුවක් පෙන්වාදෙන ඕනම අවස්ථාවක තරාතිරම බලන්නෙ නැතුව ඒක සාධාරණ විවේචනයක් නම් මම ඒක පිළිගන්නවා.

**නායකයකු සතුවිය යුතු ගුණාංග ලෙස ඔබ සිතන්නේ ඃ-**
නායකයා නිතරම තමන් යටතේ සිටින්නන්ට ඇහුම් කන් දිය යුතුයි. තමන්ගෙ යටතේ සිටින්නන් තමයි බොහෝ දේවල් දකින්නේ. විමසිලිමත් වෙන්නෙ. නායකයා ගමන් කරන දිසාව වගේම නිවැරදි විය යුතු තැනුත් ඔවුන් දකිනවා. ඔවුන් කියන දේවල් සාවධානව අසා සිටීම ප්‍රගුණ කළ යුතු ගුණාංගයක්

**ඔබ හිතන විදිහට ඔබ වඩාත්ම කුසලතාවන් ප්‍රකට කරන්නේ ඃ-**
මම හිතනවා කළමනාකරණය පැත්තෙන් මම කුසලතාවක් දක්වනවා කියලා

**ඔබේ ජීවිතයේදී හමුවූ වඩාත්ම ආකර්ශනීය පුද්ගලයා, ඔහු/ඇය තුළ ඔබ දකින සුවිශේෂීතාවය ඃ-**
බිරිඳ, ඇය ඉතාම දූරදර්ශී කාන්තාවක්.ඇය තමන් යටතේ සිටින්නන්ට හොඳ නායිකාවක්, ඒ වගේම බිරිඳක් මවක් විදිහට සිය යුතුකම් නොපිරිහෙලා ඉටුකර න්නට නිතරම මහන්සි වෙන හොඳ ගෘහනියක්.

**ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂ්‍යය (Turning Point)ඃ-**
ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගමේ සභාපති ප්‍රේමලාල් මහත්තයා මට ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගමට කතා කරපු එක. ඔහුගේ ආයෝජන කටයුතු (Investment Strategic Planning) භාරව තමයි මට කටයුතු කරන්න ලැබුණෙ. මේ හරහා තමයි ඉන් පස්සෙ මට ග්‍රාමින් එකට සම්බන්ධ වෙන්න ලැබෙන්නේ. ජීවිතයට ඒ වගේ අවස්ථාවක් ලබා දීම පිළිබඳව ප්‍රේමලාල් මහතා ගැන මගේ හිතේ තියෙන්නෙ විශාල ගෞරවයක්.

**මෙතෙක් ජීවිතයේ භාරගත් ලොකුම අභියෝගය ලෙස ඔබ සිතන්නේඃ-**
කඩා වැටුණු සමාගමක් බොහෝ ගැටළු සහ අභියෝග මධ්‍යයේ භාරගෙන එහි ප්‍රධාන විධායක නිළධාරියා ලෙස සමාගම සහ එහි සේවක පිරිස ආරක්ෂා කර ගනිමින් එය තිබූ තත්වයටත් වඩා ඉහළට ගෙන ඒමට ලැබීම ජීවිතයේ මම ලැබූ ලොකුම අභියෝගය වගේම ජයග්‍රහනයත් විදිහටයි මම දකින්නේ මේ කාර්යයේදී අපේ හිටපු සභාපති තුමන්ගෙන් හා උප සභාපතිනියන්ගෙන් ලැබුණු ශක්තිය සහ ආශීර්වාදය අතිවිශාලයි. ඒ වගේම මගේ කාර්යමණ්ඩලය, ඔවුන් මට දැනෙන්නේ මේ ආත්මෙ විතරක් නෙවෙයි සසර පුරා එකට සිටිමින් ආත්මීයව මාහා බැඳුණු පිරිසක් විදිහටයි.එහෙම බැඳීමක් නැති හතර අතට අදින පිරිසක් එක්ක කවදාවත් මේ ජයග්‍රහනය ලබන්න අපිට පුළුවන් වෙන්නෙ නෑ.

**ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද ඃ-**
අනිවාර්යයෙන්ම

**ඔබේ ප්‍රියතම ගායකයා ඃ-** මම මේ ගායකයට ප්‍රියයි කියලා එක්කෙනෙක් කියන්න බෑ. මොකද මම අමරදේව මාස්ටර්ගෙ ඉඳලා නිහාල් නෙල්සන් මහත්තයා දක්වා ඕනෑම ගායකයකුගේ හොඳ ගීත අහනවා රසවිඳිනවා, සිංහල ගීත විතරක් නෙවෙයි බටහිර ගීත පෙරදිග ගීත මේ ඕනෑම ගීයක් අහලා රසවිඳින්න හැකි රසවින්දන මට්ටමක් මට තියෙනවා.

**ගීතය ඃ-** ගීතත් එහෙමයි විශාල පරාසයක් පුරා පැතිරුණු විවිධ ගීත අහන්න මම කැමැතියි. ඒ නිසා එක ගීයක් මම විශේෂයෙන් කැමැතියි කියලා කියන්න බෑ. ඒ ඒ අවස්ථානුකූලව ඒ ගීත වෙනස් වෙනවා

**චිත්‍රපටිය ඃ-** චිත්‍රපටියක් කියලා ගත්තොත් මෑතකදි බලපු චිත්‍රපටි අතරින් සමනල සංධ්වනිය මගේ හිත ගත්තු තරමක් වෙනස් චිත්‍රපටයක්.

**කෘතිය ඃ-**
මම හුගක් පොත් කියවන්න කැමැති කෙනෙක්. පොතක් කියවද්දි ඒකේ චිත්ත රූප අපේ හිතේ මැවෙනවා. ඒක අපේම අත්දැකීමක් වෙන තරමට හිතට සමීප වෙනවා. මේ නිසාම මම කියවපු නවකතා ඇසුරෙන් නිර්මාණය කෙරුණු චිත්‍රපටි ටෙලිනාට්‍ය බලන්න මම කැමති නෑ. මොකද සාමාන්‍යයෙන් නවකතාවක් ඒ මුල් නිර්මාණයේ රසයෙන් 100% නැවත ප්‍රතිනිර්මාණය කරන්න අමාරුයි. එතකොට අපි මුල් කෘතිය කියවලා වින්ද රසය දෙවෙනි නිර්මාණයෙන් ලැබෙන්නෙ නෑ. මම කියවපු පොත් අතරින් 2010 කියවපු Williom Novak ගෙ LEE Iacocca කියන ස්වයං ලිඛිත චරිතාපදානයට මම කැමතියි

**අනාගත ඉලක්කය ඃ-**
මගේ ජීවිතේ බොහෝ ඉලක්ක මම මේ වෙනකොට සම්පූර්ණ කරගෙන තියෙනවා කියලා මම හිතනවා. ජීවිතේ ඉදිරි කාලෙදි මගේ අත්දැකීම් තුළින් රටට වැඩදායී පුද්ගලයින් පිරිසක් බිහිකරන්න වගේම මේ රට වෙනුවෙන් මගේ කාලය ශ්‍රමය වැයකරන්න මම උත්සාහ කරනවා.

සාකච්ඡා කළේඃ මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි

වසන්කිරීමට නොහැකි එකම දෙය හෘද සාක්ෂියයි.

# කන්න ක්‍රමයට ණය අය කර ගැනීමේ ක්‍රමයක් තියෙනවා නම් අපි ඉතාමත් කැමතියි....

මඩකලපුව මංකාඩු වලින් හැරී ජී.එස් පාරේ මද දුරක් ගමන් කරන අපිට දේවකීගේ වගා බි
හමුවේ. අතු ඉති පුරා සිය එලදාව පුරවාගත් මිරිස් ගස්, වම්බටු ගස් සේම මඤ්ඤොක්කා බු
ආදී බෝගයන්ද තමන් නිරන්තර සාත්තු සප්පායම් ලබන බිමක වෙසෙන බව අප හමුවේ ගොළු බසින් කියා පායි. කේ. දේවකී මේ සරු බිමේ උරුමක්කාරියයි






මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුණේ මගේ වගාවන් සඳහා ණය මුදලක් අවශ්‍ය වූ නිසයි.ඒ මීට අවුරුදු හතරකට විතර කලින් . එදා ඉදන් මේ දක්වා අවශ්‍යතාවය අනුව රු. 25000, 50000, 100000, 150000, ආදී වශයෙන් ණය මුදල් අරන් තියෙනවා.ග්‍රාමීන් සමාගමේ සති වාරික ක්‍රමයට වඩා කන්න ක්‍රමයට ණය අය කර ගැනීමේ ක්‍රමයක් තියෙනවා නම් අපි ඉතාමත් කැමතියි. මොකද වගාවන්ගෙන් නිතිපතා ආදායම් ලැබෙන්නෙ නෑනේ. ඒත් ග්‍රාමීන් ණය ක්‍රමය සහ ආයතනයෙන් සලසාලනු ලබන සේවාවන් පිළිබඳව අපේ හිතේ තියෙන්නේ විශාල පැහැදීමක්. මෙච්චර කාලයක් ග්‍රාමීන් සමාගම සමග කටයුතු කරන්න අපි පෙළඹුනේ ඒ නිසාමයි.

**කේ දේවකී - ජී. එස්. පාර, චෙට්ටිපාලයන් , මඩකලපුව.**

## ව්‍යාපාරය පටන් ගන්න අවශ්‍ය මුදල හොයාගත්තෙ ග්‍රාමීන් දිරිය ණය ක්‍රමය හරහා




මම ග්‍රාමීන් සමාගම ගැන දැනගත්තෙ මගෙ ගෙදරට අල්ලපු ගෙදර අක්කාගෙන්. එයා එයාගේ ව්‍යාපාරයට ණය අරන් තිබුණේ ග්‍රාමීන් සමාගමෙන් . බැංකු වලින් ණය මුදලක් ඉල්ලද්දි වෙන අපහසුතා නිසාම මම ලොකු ගැටළුවකට මැදිවෙලා හිටියේ. ඉතින් ඒ වගෙ වෙලාවක මට ග්‍රාමීන් සමාගම ගැන සහ එහි ණය ක්‍රමය ගැන දැනගන්න ලැබුණාම හිතට ඇතිවුනේ කියාගන්න බැරි තරම් සතුටක්. මම අවුරුදු හතරක ඉඳන් මේ ඇඳුම් මැසීමේ ව්‍යාපාරය කරනවා. ව්‍යාපාරය පටන් ගන්න අවශ්‍ය මුදල මම හොයාගත්තෙත් ග්‍රාමීන් දිරිය ණය ක්‍රමය හරහා.

එතැන ඉඳන් අද මේ වනතුරුත් මම ග්‍රාමීන් සමාගමෙන් ණය ගන්නවා. මෙම මේක පටන් ගනිද්දි මහත්තයා හිටියේ රට. දැන් එයා මගේ ව්‍යාපාරයට සම්බන්ධ වෙලා කටයුතු කරනවා. තව කිහිප දෙනෙකුට රැකියාවන් සපයා දෙන්නත් මේ වෙනකොට අපිට පුලුවන් වෙලා තියෙනවා. ණය ගන්න වගේම ග්‍රාමීන් සමාගම සපයන සේවාවත් ඉතා විශිෂ්ඨයි කියන්නේ මුළු හදවතින්මයි.

ශාන්ත ලූසියා
ඇන්නෙයි තෙරේසා වීදිය
කීරි මන්නාරම

## ග්‍රාමීන් සමාගම අපි ගැන තබා තියෙන විශ්වාසය අපි පලුදු නොකර රකිනවා



කීරි මන්නාරම් වෙරළ තීරය සෙනසුරාදා - ඉරිදා සහ නිවාඩු දිනයන්හි දී දේශිය මෙන්ම විදේශීය සංචාරකයින් ගේද නොමඳ පහස ලබන වෙරළ තීරයකි. කීරි වෙරළ තීරයට සපැමිණෙන ආගන්තුකයන්ට ආහාර ද්‍රව්‍ය සම්පාදනය සහ පවිත්‍රතා කටයුතු සලසාලීම සඳහා කටයුතු සම්පාදනය කරන්නේ ජේයකුමාර් විජිතාය. සෑම වසරකම ඒ සඳහා ටෙන්ඩර් කැඳවා ලබාදෙන එම අවස්ථාව මේ වසරේ තමා සන්තක කරගන්නට විජිතාට හැකිවිය.

මම මේ අවුරුද්දේ තමයි ටෙන්ඩර් එක අරන් මෙතැන ව්‍යාපාර කටයුතු කරන්න පටන් ගත්තේ. ඊට කලින් මම මහත්තයාගේ ධීවර කටයුතු සඳහා උදව් කළා. අපේම බෝට්ටුවේ මහත්තයා මාළු අල්ලන්න යනවා. සංචාරකයන්ගේ පවිත්‍රතා කටයුතු වලට අවශ්‍ය පහසුකම් සපයා දිමත් මෙතැන කඩේ පවත්වා ගෙන යාමත් තුළින් තමයි මට ආදායමක් ලැබෙන්නේ. 2005 ඉඳන් මම ග්‍රාමීන් සමාගමත් එක්ක ගනුදෙනු කරනවා. ධීවර කර්මාන්තයට මෙන්ම මේ ව්‍යාපාරය කරගන්නත් අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන හොයාගන්න HNB ග්‍රාමීන් දිරිය ණය මුදල පහුගිය අවුරුදු ගණන පුරාම මට පිහිට වුණා. ග්‍රාමීන් සමාගමෙන් දහවතාවකට වඩා මම ණය මුදල් ලබාගෙන තියෙනවා. ග්‍රාමීන් සමාගම අපි ගැන තබා තියෙන විශ්වාසය අපි පලුදු නොකර රකිනවා කියන්න ඒකම ඇතිනෙ."

ජේය කුමාර් විජිතා
මුහුදු පාර, කීරි මන්නාරම

## Easy Loan..... නමටම ගැලපෙන ක්ෂණික ණයක්




මම මගේ ව්‍යාපාරය මුලින්ම පටන් ගත්තේ මීට අවුරුදු 12 කට ඉස්සෙල්ලා. ඉතාම පුංචි ව්‍යාපාරයක් විදියට. පෙසාලේ හාඩ්වෙයාර් බඩු අලෙවි කරන ස්ථාන ඒ තරම් නැති නිසා මට ව්‍යාපාරය තුළ ලොකු තරගයක් තිබුණෙ නැහැ. කොහොම වුණත් ක්‍රමයෙන් ව්‍යාපාරය දියුණු කර ගන්න මට පුළුවන් වුණා. මේ අතර මගේ ගෙදර ඉදිකිරීම් කටයුතු නිසා පසුගිය කාලේ ව්‍යාපාරයේ යම් පසුබෑමක් වුණා. ඒ නිසා ව්‍යාපාරය නැවත යථා තත්වයට ගේන්න මුදල් අවශ්‍ය වුණා.

ඒ මුදල් හදිස්සියට මම පිළියම් හෙව්වේ HNB ග්‍රාමීන් Easy Loan වෙතින් Easy බද්බ කියන නමටම ගැලපෙන විදියට ඉතාම ඉක්මණින් මට මේ ණය මුදල ගන්න ලැබුණා. Easy Loan ණය මුදල මම අවස්ථා කිහිපයකදිම ගත්තා. රු.ලක්ෂ 8 -10 සහ මිලියන දෙක ආදි වශයෙන් . වෙනත් මුල්‍ය ආයතන වලට වඩා ඉක්මනින් සහ පහසුවෙන් Easy Loan එකක් ගන්න පුළුවන් නිසා මම ණය මුදලක් ගනිද්දි වෙනත් ආයතන ගැන හිතන්නේ නැහැ.

ජොන්සන් ප්‍රනාන්දු - ප්‍රනාන්දු හාඩ්වෙයාර්, පේසාලෙ

# ඔවුන්ගේ සතුටු කඳුලේ උරුමකරුවෝ ඔබය...



හිසට සෙවණයි - සිතට සතුටයි



දරුවන් හය දෙනා සමගින් ඉනෝකා සහ ඇගේ සැමියා ජීවත් වූ පැරණි නිවස

දිරාගිය පොල්අතු අස්සෙන් අනවසරයෙන් ගේ තුළට කඩාපාත් වී දෑස්පියන් රත්කරන හිරු එළිය දවස උදාවූ බව කියමින් කරන හිරිහැරයට වඩා අක්ක මලෝට නොරුස්සන්නේ හිටි හැටියේ කඩාපාත්වී ගේ ඇතුලේ කුඩාදිය ඇලි තනන වැහි දියෙන් වන අතවරයන්ය. ඒ වැස්ස දහවලකටත් වඩා රැයකදී කඩාපාත් වුනොත් ඒ නිදිවර්ජිත රාත්‍රිය පුරා කුඩා මල්ලියාවත් තුරුළු කරගෙන බියපත් දෑසින් අම්මා ගේ පුරා ඇවිදින්නේ තම දරුපැටවුන්ට නොතෙමී ඉන්නට හැකි තැනක් සොයන්නටය. ගෙවී ගිය මතක ඇති කාලය පුරා අව්වත් වැස්සත් සමග ඔට්ටුවෙමින් හෙම්බත්වූ ජීවිතයට සරණක් සොයා ගේ පැළක් අටවාගන්නට උදව්කරන්නැයි ඉල්ලමින් ඉනෝකා නොගිය තැනක් නැත. උදව්කරන්නට එකග වූවන් සිටියද කුමක් හෝ හේතුවකින් ඒවා යල්පැන යද්දී HNB ග්‍රාමීන් පුත්තලම ශාඛාවේ ණය විධායක නිළධාරී ප්‍රසාද් බුද්ධික තම වන්නියතිච්ච මධ්‍යස්ථාන සාමාජිකාවගේ දුක පුත්තලමේ ශාඛා කළමනාකාර තුමන්වෙත ඉදිරිපත් කරන්නේ අපි කට්ටිය හරි එකතුවෙලා ඒ දරුපැටවුන්ට නොතෙමී ඉන්න තැනක් හදාදෙමු යන ඉල්ලීමද සමගිනි.

ප්‍රසාද්ගේ ඉල්ලීම ප්‍රධාන කාර්යාලයේ "මෙහෙවර" අරමුදල වෙත යොමු වන්නේ ඉන් තරමක හෝ සහනයක් සැලසේවි යන සුබවාදී බලාපොරොත්තුවත් සමගිනි. එහෙත් ඒ දෙපැත්තට වැනුනු බලාපොරොත්තුවට තටු ලැබෙන්නේ අපි මේ මිනිස්සුන්ට ගේ හදලාදෙමු යන සතුටු වචනය HNB ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක තුමන්ගේ මුවින් නිකුත් විමත් සමගිනි.
පුත්තලම ශාඛාවේ නිළධාරීන්ගේ සොයා බැලීම් සහ උදව් උපකාරද සමගින් පියවරෙන් පියවර ගඩොලින් ගඩොල බැඳුණු ඉනෝකා සංජීවනීලාගේ නිවසට අගෝස්තු 02 උත්සවාකාරයෙන් ගෙවදින්නට ඔවුනට හැකිවුයේ ඒ දාන පාරමිතාවේ අනුහසිනි
මේ දැන් කඩා වැටෙතැයි සිතිය හැකි තරමේ අබලන් වූ නිවස ඉනෝකාගේ ඉඩමෙන් අතුරුදහන්වී ඒ වෙනුවට පුංචි සොඳුරු නිවසක් ඉදිවී තිබිණි. සිතු තැනකින් ගෙට එබෙන්නට මෙතුවක් කල් අවසර නොපැතු හිරුටත් ගෙයි එළිපත්තට වී ඉදිරිපස දොරඇරෙන තෙක් නොඉවසුම් ව බලා හිඳින්නට සිදුව ඇති අරුණක අපි ඉනෝකාගේ නව නිවහනට එහි අලුත් අසිරිය දකින්නට ගොඩවුනෙමු. ලහි ලහියේ අලුත් පාසැල් බෑග් උරයේ රඳවා ගත් ඉනෝකාගේ පාසැල් යන වයසේ සිටි දියණියන් දෙදෙනා සහ පුතු පාසැල වෙත පියමනින්නට සූදානමිය.
කොහොමද අලුත් ගේ හොඳද.....
කුඩවුන්ගේ දෑස් දීප්තියෙන් සිනාසේ ... ඒ තුළ කැටවූ සතුටු කතා දහසකි. ගෙයි එක්පැත්තක වූ කුඩා මේසය මත පිළිවෙලට තබා ඇති පාසැල් පොත් දැන් වැස්සට තෙමෙන්නේ නැත. තියෙන දෙයක් කා



HNB ග්‍රාමීන් 'මෙහෙවර' අරමුදල පුත්තලමේ අට දෙනෙකුගෙන් යුතු පවුලකට හිසට සෙවණක් තනා දෙයි..

සතුටින් සිටින්නට දැන් ඔවුන්ගේ හිසට සවිමත් සෙවණක් ලැබී ඇත.
"අපිට දරුවො හය දෙනෙක් ඉන්නවා.මමත් මගේ මහත්තයත් අපේ පවුලේ අනාගතය වෙනුවෙන් හුගක් මහන්සි වෙලා වැඩ කරනවා. මහත්තයා සර්විස් සෙන්ටර් එකේ වැඩ කරලා උපයන මුදල දරුවන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවෙන නිසා මම තීරණය කළා ස්වයං රැකියාවක් කරන්න. මට ඇඳුම් මහන්න පුළුවන්. ඒ නිසා මහන මැෂිමක් මිලදී ගන්න HNB ග්‍රාමීන් "දිරිය" ණය මුදලක් ඉල්ලා සිටියා. ඒ 2012 අවුරුද්දේදී. එතැන් පටන් මේ දක්වා මගේ ව්‍යාපාරය දියුණුකර ගැනීම සඳහා HNB ග්‍රාමීන් දිගින් දිගටම මට සහයෝගය ලබා දුන්නා. මගේ පුංචි ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්නට මුල්‍ය සහයෝගය ලබා දීමෙන් නොනැවතී මටත් මගේ මේ අහිංසක දරුවන්ටත් ඉන්න හිටින්න තැනක් හදාදීලා ග්‍රාමීන් එකේ මහත්තුරු කළේ වචනයෙන් විස්තර කරන්න බැරි විශාල පිංකමක් "තම පවුලට ලැබුණු නව නිවස නිසා උපන් සතුටු කඳුළු පිරුණු දෑසින් යුතුව ඉනෝකා මහත්මිය පවසන්නේ කෘතඥපූර්වකවය.
මෙහෙවර අරමුදලේ අනුහසින් ඉදිවුණු ඉනෝකාලාගේ ගෙදර යථාර්ථයක් බවට පත්කරන්නට වෙහෙසුණු ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් පුහුණු අංශ ප්‍රධානී - අනුර උඩවත්ත මහතා සිය හැගීම් අප හමුවේ වචන වලට පෙරලුවේ මෙලෙසිනි " HNB ග්‍රාමීන් සේවක පිරිසෙහි දායකත්වයෙන් ගොඩනැගුණු මෙහෙවර ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ඕනෑම පළාතක ජීවත් වන උපකාර අවශ්‍ය ගනුදෙනුකරුවන්ගේ සුබසාධනය වෙනුවෙන් සිය දායකත්වය ලබා දෙනවා. රටේ ප්‍රමුඛතම ක්ෂුද්‍ර මුල්‍ය සේවා සැපයුම්කරුවෙකු බවට පත්වීම සඳහා අපට පදනම සපයන අපගේ හිතෛෂීවන්ත ගනුදෙනුකරුවන් වෙනුවෙන් උපකාර අවැසි තැන එය උපරිමයෙන් ඉටුකිරීමයි අප සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී/කළමනාකාර අධ්‍යක්ෂ චමින්ද ප්‍රභාත් මහතාගේ අරමුණ. අපි කැපවෙන්නෙ ඒ අරමුණ වෙනුවෙනුයි....."
සතුට ඇත්තේ මුදල් මත හෝ යසඉසුරු මත නොවේ. සිත ලබන අස්වැසිල්ල හා තෘප්තිය මතය. කෙනෙකුන්ගේ දෑසක කඳුලක් වෙනුවෙන් උණුවෙන හදවතක උණන කඳුලට ඇත්තේ අමිල වටිනාකමකි. ඒ දුක් කඳුල හිමි දෑස් මත සතුටු කඳුලක් රඳවන්නට දරන වෑයම අවසන සිතට දැනෙනුයේ අස්වැසිල්ලකි. තෘප්තියකි. දරුවන් සය දෙනෙකු සමගින් ඉනෝකාත් ඇගේ සැමියාත් අද ලබන සතුටෙහි නිත්‍ය උරුම කරුවෝ ඔබය. ඒ මෙහෙවර අරමුදල සවිමත් වන්නේ ඔබගෙන් වන හෙයිනි. එසේහෙයින් මිල මුදලට ඔබ්බෙන් වූ ඒ නිරාමිස සතුට මේ මොහොතේ මට මෙන්ම ඔබටත් දැනෙනු නිසැකය.



සටහන -
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායාරූප -
නිර්මාණ/ලක්ෂ්මන්

# අපේ හිතේ හයිය වගේම ග්‍රාමීන් සමාගමෙන් ලැබුණු මූල්‍ය ශක්තියත් අපිව මේ තැනට ගෙනාවා....

මන්නාරමේ සිට තලේ මන්නාරම දක්වා විහිදෙන මාර්ගය අතරමැද තැනකදී පේසාලේ හමුවෙයි. පේසාලේ සිට කුඩා අතුරු මාවත් දිගේ ඉදිරියට යන අපගේ නෙතු මානයට හමුවනුයේ තෙරක් නොපෙනෙන මහ සයුරය. කරිප්ප ගඳට මුසුවු පිළිගඳ මේ ප්‍රදේශය ධීවර කර්මාන්තය යහමින් කෙරෙන ප්‍රදේශයක් බවට කරනු ලබන ඉඟිය සනාථ කරනුයේ වෙරළ දිගේ නවතා ඇති විවිධ ප්‍රමාණයේ ඔරු හා බෝට්ටුය. "අද ස්ට්‍රයික් එකක් ඒකයි ඔය ඔක්කොම බෝට්ටු වෙරළට ගොඩ ගහල තියෙන්නේ ......... "ඒසා විශාල ඔරු බෝට්ටු ප්‍රමාණයක් එකතැනක නවත්වා තිබෙනු දකින අපේ කුතුහලය සන්සිඳුනේ සෝනියාගේ වචනත් සමඟය.

"යං සර්ලා ගෙදරට ...."දෙමළ බසින් එසේ කියමින් ඉස්සර වුණු සෝනියාගේ නිවස තිබුනේ වෙරළ මානයේම ඊට මඳක් ඔබ්බෙනි. මන්නාරම ප්‍රාදේශිකය භාර ප්‍රාදේශීය කළමනාකරු වු ජෝශප් ජෝන් මහතා අප සමඟ හිඳිමින් සෝනියා ද්‍රවිඩ බසින් පවසන සියල්ල සිංහලයට නඟන්නට උත්සුක වෙයි.

"මම ඉපදුන් පෝසාලෙමයි. සෙන්ට් මේරි විද්‍යාලයට ගියා ඉගෙන ගන්ට. තාත්තා මුහුදු රස්සාව කරපු නිසා මුහුද සහ ධීවර රැකියාව අපේ ජීවිත වලට එදා ඉඳන්ම සම්බන්ධයි.

අපි හැදුනේ වැඩුනේ මේ වෙරළෙමයි. අපේ තාත්තා මමයි අයියලා තුන් දෙනයි අක්කයි නංගියි ජිවත් කළේ ධීවර රැකියාවෙන් උපයන මුදලින් - මගේ පාසැල් ගමන සාමාන්‍ය පෙළින් පස්සේ නැවතුණා. 2007 දී මම විවාහ වුණා. මහත්තයත් කළේ මුහුදු රස්සාව. මහත්තයට බෝට්ටු තිබුණා.

අපේ ජීවනෝපාය වුණොත් බෝට්ටු රස්සාව. ඔය කාලෙම තමයි ග්‍රාම සංවර්ධන සමිති හරහා ඒවායේ තිබුණු රැස්වීම් වලදි ග්‍රාමීන් සමාගම ගැනත්



ඒකෙන් ණය මුදල් ලබාදෙන ආකාරය ගැනත් අපිව දැනුවත් කළේ. ඒ වෙනකොට ධීවරයින් වෙනුවෙන්වත් වෙනත් ස්වයං රැකියා කරන අය වෙනුවෙන්වත් මූල්‍ය ආධාර හෝ ණය ලබාදෙන මේ වගේ ආයතනයක් තිබුනේ නෑ. බැංකු ණය ලබාදුන්නට අපි වගේ උදවියට ඒ ණය ලබාගන්න ඒ තරම් පහසු වුණේ නැහැ. මේවගේ පසුබිමක් තුළ හඳුන්වා දුන්න ග්‍රාමීන් ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය මේ පළාත් වල



## ග්‍රාමීන් ශක්තියයි ඇගේ දිරියයි

ජනතාවට විශාල සහනයක් වුණා.. ඒ මහත්තුරු අපේ ගෙවල් වලට කිට්ටුවම මධ්‍යස්ථාන ඇති කරලා අපිට තේරෙන විදියට අපේ භාෂාවෙන් කතා කරලා අපට අවශ්‍ය උපදෙස් විතරක් නෙවෙයි ගත්ත ණය මුදල නිසි විදියට කළමනාකරණය කර ගන්න විදිහ පවා කියා දීලා තමයි ණය මුදල ලබාදුන්නේ. අනික ඒ කාලේ මේ විදියට ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදුන්නේ ග්‍රාමීන් ආයතනය විතරයි.

මම ග්‍රාමීන් සමාගමට බැඳිලා මුලින්ම ගත්තේ රු.5000.00 ක ණය මුදල ඒ 2008 දි විතර - ඒ මුදල් වලින් දැල් ආම්පන්න ගත්තා . ධීවර රැකියාවේ නියුතු අයට වැඩිපුරම මුදල් අවශ්‍ය වන්නේ දැල් ආම්පන්න වලට තමයි. මහත්තයා මුහුදු ගිහින් ආවම මම තමයි මාළු අයින් කරලා දැල් සුද්ද කරලා ඒ කටයුතු කරන්නේ. අපෙන් මාළු මිලදී ගන්න අය මේ වෙරළටම ඇවිත් මාළු මිලදී ගන්නවා. බැරිවෙලාවත් මාළු ඉතුරුවුණොත් ඒවා කරවල වලට වේලන එක තමයි කරන්නේ.

මම මේ වෙනකොට ග්‍රාමීන් සමාගමෙන් අවස්ථා ගණනාවකම ණය අරන් තියෙනවා. රු.5000 ඉඳලා රු. 150000 වෙනකම්ම. අවුරුදු දහයකට ආසන්න කාලයක් අපි HNB ග්‍රාමීන් සමාගම එක්ක ගනුදෙනු කළා. මේ නිසා ග්‍රාමීන් එක කියන්නේ අපිට තවත් මූල්‍ය සමාගමක් නෙවෙයි. අපේ ජීවිත එක්ක බැඳුණු අපිට නැති බැරි අවස්ථාවලදි අපට පිහිට වුණු අපේම තැනක්. ජීවිතේ අද අපි යමක් උපයාගෙන තියෙනවා නම් ඒ සඳහා අපේ හිතේ හයිය වගේම ග්‍රාමීන් සමාගමෙන් ලැබුණු මූල්‍ය ශක්තියත් ඉවහල් වුණු බව කියන්නම ඕනෙ.

පේසාලේ වැල්ල තද හිරු රශ්මියෙන් ගිණියම් වී ඇත. වෙරළ පුරා ඇති කලබලයට බලපෑම් කරන්නට ඒ හිරු රශ්මියට හැකියාවක් නැත. කරවල මෙන්ම ඉර අව්වට වේලි පදම් වුණු ඔවුන්ගේ ජීවිත තෙරක් නොපෙනෙන මහ මුහුද සමඟ පොරබදිමින් එදා වේල වෙනුවෙන් අනවරත අරගලයක නියැලෙයි. ගෙවී යන්නේ දවස් පමණක් නොවේ. ජිවිත ද ඒ හා සමඟම ගෙවී වියපත් වෙයි. ඒ වියැකෙන කාලය පුරා මේ දුක් විඳින මිනිසුන් සමඟ හිඳිමින් ඔවුන්ගේ දුක සැප බෙදා ගත් HNB ග්‍රාමීන් සමාගමේ නිලධාරීන්ටද ධීවරයින්ගේ ජිවිතවල කොටස් කරුවන් වෙමින් ගෙවු කාලය ගැන කියන්නට තෘප්තිමත් සුසුමකින් කෙළවර වෙන මහා දිගු කතාවක් තිබේ.







සටහන
මංජුල හෙට්ටිආරච්චි
- ඡායාරූප -
ලක්ෂ්මන් කුමාරතුංග

# HNB ග්‍රාමින් තරු රැයේ කැලුම් විහිද වූ තරු



**HNB** ග්‍රාමින් සමාගමේ **Night of Stars 2016/17** වාර්ෂික ප්‍රගති සමාලෝචන හමුව පසුගිය ජූලි 01 වෙනිදා අති මහත් උත්කර්ෂවත් අන්දමින් පවත්වන්ට යෙදුණේ වසරක් තුළ විවිධ අංශයන්ගෙන් කුසලතා දැක්වූවන් සම්මානනීයන් බවට පත්කරමිනුයි.එක් දහස් හයසියයකට අධික වූ සේවක පිරිසක් අතරින් මෙලෙස ඇගයීමට ලක්වීම සැබැවින්ම ඔවුන් සතු කැප වීම සහ කුසලතාව ප්‍රකට කිරීමක් ලෙස හඳුන්වාදිය හැකියි. එදින ඇගයුම් සම්මාන ප්‍රසාදයට පාත්‍ර වූ සියල්ලන්ටම **HNB** ග්‍රාමින් පවුලේ සුභාෂිංශන පිරිනමන අතරම ඔවුන් අතරින් සම්මානයට පාත්‍ර වූ අප සහෘදයන් කිහිපදෙනකුන් සිය වෘත්තීය අරමුණු සඵල කරගැන්ම සඳහා වූ වෙහෙස මහන්සිය පිළිබඳව මෙහෙවරට අදහස් දැක්වූයේ මෙසේය.



**තම ශාඛාවන් නිසි ගමන් මාර්ගයක ගමන් කරවීමේ නායකත්වය භාර ගනිමින් තම ප්‍රාදේශිකයට අයත් ශාඛාවන්හි කුදු මහත් සෑම කටයුත්තකම මෙහෙයවීම සිදුකරමින්ද තම කාර්ය මණ්ඩලය නිරන්තර අභිප්‍රේරණයකට ලක් කරමින්ද මහාසමාජය සහ තම ශාඛාව යා කරන හුය බවට පත්වෙමින්ද ප්‍රාදේශිකය නම් වූ පවුලේ ලොකු අයියාගේ භූමිකාව සිය උරමතට ගනිමින් විශද කළ මහා කාර්ය භාරය ඇගයුමට ලක් කරමින් මෙවර පැවති වාර්ෂික ප්‍රගති සමාලෝචන හමුවේදී හොඳම ප්‍රාදේශීය කළමනාකරුව ඇගයීම ප්‍රථම වරට සිදුකරන ලදි. එහිදී 2016/17 වසරේ හොඳම ප්‍රාදේශීය කළමනාකරු ලෙස ඇගයීමට පාත්‍රවූයේ ගාමිණී ආරියසිංහ මහතාය.**

ආයතනයක ප්‍රධාන සම්පත එහි කාර්ය මණ්ඩලය. ඒ වගේම තමයි අපිත් එක්ක සමීපව කටයුතු කරන අපේ ගනුදෙනුකරුවන්. මේ දෙපාර්ශ්වය අතර හොඳහිත වර්ධනය කිරීමේ වගකීම ප්‍රාදේශිය කළමනාකරුවන් සතු වෙනවා. ඒ වගේම තමන්ගේ කාර්ය මණ්ඩලය මැනවින් හසුරුවමින් ඔවුන්ගේ දක්ෂතා වලින් ප්‍රයෝජන ගැනිමට වගේම ඒ අයගේ ප්‍රශ්න හඳුනා ගනිමින් ඒවාට විසඳුම් ලබා දිමට මැදිහත් වීමත්, ප්‍රාදේශීය කළමනාකරුවෙකුගේ වගකීමක් ලෙසයි මම හිතන්නේ. මගේ වෘත්තිය ජීවිතය තුළ හැමවිටම මගේ වගකීම හඳුනාගෙන එය සමබරව ඉටු කිරිමටයි නිරන්තරව වෙහෙස වුනේ. ඒ කැපවීමට ලැබුණු මේ ඇගැයීම මට හුඟක් වටිනවා. මොකද මට විතරක් නෙවෙයි අපේ කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාම වෘත්තිය ජිවිතය තුළ විවිධ අයුරින් කැපකිරීම් කරනවා. ඒ කැපකිරීම් අගය කිරීම තමයි සේවකයෙකුට තියෙන ලොකුම සතුට.... ඒ බව තේරුම් ගත හැකි නිරත්තරව සේවකයින්ගේ පැත්තෙන් හිතන ඔවුන්ව අගය කරන ඉහළ කළමනාකාරිත්වයක් ලැබීමත් සේවකයින්ගේ භාග්‍යයක්.

**ක්ෂුද්‍ර මූල්‍ය ණය නිකුත් කිරීමට අමතරව HNB ග්‍රාමින් සමාගම සුළු හා මධ්‍ය පරිමාණ ණය නිකුත් කිරීමත් (SSE Loan) මේ වනවිට සිදුකරනවා. දිවයින පුරා විසිරුණු ශාඛා ජාලයෙහි 100 ආසන්න කාර්ය මණ්ඩලයකින් හොදම අළෙවි විධායක වරයා ලෙස සම්මානයට පාත්‍රවූයේ මන්නාරම ශාඛාවේ ක්‍රිස්ටි මයුරන් සුසායි මහතායි**



මම ග්‍රාමින් සමාගමට සම්බන්ධ වෙලා මේ වෙනකොට අවුරුදු දෙකකට කිට්ටුයි. HNB ග්‍රාමින් සමාගමේ සේවයට එන්නට පෙර මම වෙනත් ආයතනයක සේවය කළා. මන්නාරම ශාඛාවේ SSE ණය කළමනාකරු (Small Scale Entrepreneur) විදිහට වැඩ භාරගත්තාම මට ඒක තරමක ලොකු අභියෝගයක් විදියට දැණුනා.

මොකද HNB ග්‍රාමින් එකේ අලුතින්ම ආරම්භ කරපු සේවාවක් විදිහට අලුතින්ම හැම දෙයක්ම කරන්න සිද්ධ වුණ නිසා. හැබැයි මෙතනදි මගේ මන්නාරම් ශාඛාවේ කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහාය විශේෂයෙන් සිහිපත් කළ යුතුයි. ගනුදෙනුකරුවන් සොයා ගන්න ඔවුන්ගේ සම්බන්ධකම් මට ලබාදුන්නා. ඊට අමතරව ටවුන් ප්‍රමෝෂන් වලින් ගෙවල් ගානේ සහ ව්‍යාපාරික ස්ථාන ගානේ ගිහින් කරපු දැනුවත් කිරීම් වලින් අපිට ගනුදෙනුකරුවන් සොයා ගන්න පුළුවන් වුණා. මේ විදියට ආයතනයට මම ලබාදුන්න සේවයට ආයතනයෙන් පෙරලා මට ලැබුණු උපහාරයක් විදිහට මේ සම්මානය මම දකිනවා.




**HNB ග්‍රාමින් නමත් ක්ෂුද්‍ර මූල්‍ය සංකල්පයත් ගසට පොත්ත මෙන් බැඳුනක්. ආයතනය කාලයත් සමග ව්‍යුහාත්මක වර්ධනයන් කරා ගමන් කළත් ක්ෂුද්‍ර මූල්‍ය සේවාවට හිමි වන විශේෂත්වය පෙර පරිදිමයි. දිවයින පුරා විසිරුණු 600 පමණ වූ ක්ෂුද්‍ර මූල්‍ය ණය විධායකයින් අතරින් හොදම ණය විධායක ( ක්ෂුද්‍ර මූල්‍ය ) ලෙස සම්මානයට පාත්‍ර වූ අම්පාර ශාඛාවේ මොහොමඩ් සජීර් මහතා සිය ජයග්‍රාහී හැගීම මෙහෙවරට ප්‍රකාශ කළේ මෙලෙසිනි.**



මම ග්‍රාමින් සමාගමට ආවේ 2012 සැප්. 17 වෙනිදා. මේ මගේ දෙවෙනි ජොබ් එක. කොළඹ රස්සාව කර කර ඉඳලා ගෙදර ආපු වෙලාවක මගේ යාළුවෙක්ගේ මාර්ගයෙන් තමයි ග්‍රාමින් සමාගම ගැන දැනගත්තේ. ඒ වෙනකොට ගෙදරින් දුරස්ව ඉන්න සිදුවීම නිසාම ඒ රස්සාව මට එපා වෙලා තිබුනේ. මම යාළුවගේ මාර්ගයෙන් ග්‍රාමින් සමාගමට සම්බන්ධ වුණා පුහුණු විධායක නිලධාරියෙක් විදිහට. එදා ඉඳන් ගෙවිගිය අවුරුදු පහ පුරාම මගේ වෘත්තිය නිවැරදිව හා අවංකව කරන්නයි මම උත්සාහ කලේ. විශේෂයෙන් මම ඉලක්ක පසුපස ගියේ නැහැ. ලබාදුන්න ඉලක්කය අභිබවා වැඩ කරන්නයි නිතරම උත්සාහ කලේ. එදා Night of Stars එකට එන්න කියලා ආරාධනා පත්‍රය ලැබුණාම මම හිතුවේ ප්‍රාදේශිකය තුළ මට කිසියම් තැනක් ලැබිලා ඇති කියලා. ඒත් දිවයිනේම පළමු ස්ථානය දිනාගත් හොඳම ණය විධායක (කෂුද්‍ර මුල්‍ය) විදිහට සම්මානය ලැබුණාම ඒක මට හිතා ගන්නවත් බැරි වුණා. මාව මේ විදියට ඇගැයිම සම්බන්ධව HNB ග්‍රාමින් සමාගමට මම ස්තුතිවන්ත වෙනවා.

**ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක ණය නිළධාරි තනතුර රැකියාව ලෙස තෝරා ගැනීමම අභියෝග භාර ගැනීමේලා තරුණ නිළධාරියකු සතු හැකියාව කදිමට ඔප්පු කරන සාධකයක්. මේ අය අතුරිනුත් මාස හයට වැඩි අවුරුද්දට අඩු සේවා කාලයක් සැපිරූ වඩාත් අපේක්ෂා සහගත ක්ෂුද්‍ර මූල්‍ය ණය නිළධාරීවරයා ලෙස 2016/17 වසර සඳහා තේරුනේ වවුනියාව ශාඛාවේ එස්. ප්‍රශාන්තන් මහතාය.**

මම ග්‍රාමින් සමාගමේ රැකියාවට ආවේ 2016 වසරෙදි මැයි මාසයෙදි. ක්ෂේත්‍ර නිළධාරියෙක් විදිහට. අපිට ඉලක්කයක් තියෙනවා . ඒ ඉලක්කය සම්පූර්ණ කරන අතරෙම ලබා දුන් ණය නැවත අයකර ගැනීම තුළ ඇති අවධානම කෙබදුද යන්න ගැනත් අපි නිරන්තරව අවධානයෙන් සිටිය යුතුයි. මම නිතරම උත්සාහ කළේ අවධානමක් රහිතව වැඩිපුර ණය ප්‍රමාණයක් ලබාදීම කෙරෙහියි.ඒක ණය නිළධාරියකුගේ අනිවාර්ය වගකීමක් කියලයි මම හිතන්නේ



ග්‍රාමින් සමාගමට සම්බන්ධවෙලා මේ වගේ කෙටි කාලයක් තුළ මගේ කාර්ය භාරය මේ විදිහට ඇගයීමට ලක් වෙයි කියලා මම හිතුවෙ නෑ. ඒ ගැන මා තුළ තියෙන්නේ විශාල සතුටක්. ඒ වගේමයි එදා මේ සම්මානය අතට ගනිද්දි මම හිතා ගත්තා ඊළග වසරෙදි හොඳම ණය විධායක වරයාට හිමි සම්මාන ලබා ගැනීමට හැකි උපරිම උත්සාහයක් ගන්නවා කියලා.

**සතුට අඛන්ඩව ජීවිතය පුරාවටම ඇත්නම් එතැන සාර්ථකත්වය ඇත.**

# දැනුම වඩන්නයි - තෑගි දිනන්නයි
# මෙහෙවර පැණසර

**ප්‍රහේලිකා අංක 08**

**ජයග්‍රාහකයින් තිදෙනෙකුට සදීපා ප්‍රකාශකයෝ වෙතින් රුපියල් 3000 වටිනා පොත් කට්ටල තුනක්**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ■ | ■ | 2 | | 4 | | 8 |
| 3 | | | | ■ | | ■ | |
| | ■ | ■ | | ■ | | ■ | ණ |
| ■ | 5 | ඊ | | ■ | ■ | 14 | ■ |
| 6 | ■ | ■ | | ■ | 10 | ත | 12 |
| 7 | | ■ | 11 | | | | |
| | ■ | ■ | | ■ | | ■ | ■ |
| 9 | | | ■ | 13 | | | ■ |

මෙහෙවර පැණසර ප්‍රහේලිකාවේ බහුතරයක් උපකාරකයන් සැකසෙනුයේ මෙවර මෙහෙවර පුවත්පතේ පළව ඇති ලිපි වල අඩංගු කරුණු ඇසුරිනි. එම ලිපි කියැවූ ඔබට මෙම ප්‍රහේලිකාව පිරවීම කිසිසේත්ම අසීරු නොවනු ඇත. HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට මෙම තරඟය සඳහා සහභාගී විය හැකි අතර නිවැරදිව ප්‍රහේලිකාව පුරවා එවන්නන් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් තිදෙනෙකුට සදීපා පොත් ප්‍රකාශකයෝ වෙතින් අගනා පොත් පාර්සල් 3 ක් පිරිනමන අතර, ඔබගේ විසඳුම් ලබන මස 3 වන සතියට පෙර සංස්කාරක - මෙහෙවර පැණසර, HNB ග්‍රාමීන් අංක 168, නාවල පාර, නුගේගොඩ ලිපිනයට ලැබෙන්නට සලස්වන්න.

උපකාරක,

**හරහට :-**

2. 2016 රියෝ ඔලිම්පික් උළෙලෙහි ජයග්‍රහණය ලැබූ රට මෙය වේ.
3. අවුල යන්නෙහි විරුද්ධාර්ථය දැක්වේ.
5. ලොව ප්‍රථම මෝටර් රථ සමාගම.
7. මසුරු යන්නෙන් ද මෙය හැඳින්වේ.
9. දරුණු යන්නට සමාන පදයකි.
10. බෙහෙත් පැළෑටියක් ලෙස භාවිතා කරයි.
11. යුරෝපා සංගමයේ මුලස්ථානය මෙම රටෙහි පිහිටා ඇත.
13. රා කර්මාන්තයේ දී ගසකින් ගසකට මාරු වීම සඳහා මෙය බහුලව යොදා ගනී.

**පහලට :-**

1. සෙනසුරාදා යන්නට තවත් නමකි.
2. ඩයිනමයිට් සොයා ගනු ලැබුවේ මොහු විසිනි.
4. සෞදි අරාබියේ මුදල් ඒකකය වේ.
6. බුදුරදුන් මෙම නමින් ද හැඳින්වේ.
8. තෝරා ගැනීම යන්නට සමාන අරුත් දේ
10. පාරාවෝ රජ පරම්පරාව පැවතියේ මෙම රටෙහිය.
12. ලොව සෑම දෙයකටම මෙය හිමියි
14. අදහස යන්නට සමාන පදයකි.

නම : ........................................ සේවක අංකය : ........................
ශාඛාව : ........................................ ප්‍රහේලිකාව පිරවූයේ වෙනත් අයෙකු නම්
ඔහුගේ / නම : ........................................
ඥාති සම්බන්ධය : ........................................
දිනය : .......................... අත්සන : ..........................

මෙහෙවර පැණසර ප්‍රහේලිකා අංක 08

## මේ අයත් නිවැරදි විසඳුම් එවා තිබුණා

ඩී.වී.අයි. මධුශාන් - කඩුවෙල ශාඛාව, ජී.ඩී. රන්දුණු - බලංගොඩ ශාඛාව , මිලාන් ශාමික - ප්‍රධාන කාර්යාලය, රුසිරු ප්‍රේමලාල් - කන්තලේ ශාඛාව ,ගයාන් අනුරුද්ධ - කඩුවෙල ශාඛාව, ඔකඳ ජයසිංහ - ප්‍රධාන කාර්යාලය,කේ.එල්. සඳරුවන් - නාවලපිටිය ශාඛාව , තරුෂි හංසනී - ප්‍රධාන කාර්යාලය අයි.එල්.සංජීව - ප්‍රධාන කාර්යාලය,එච්.කේ.පී.ධනංජය - නගර ශාඛාව කේ.ආර්. ගුණසේකර - කඩුවෙල ශාඛාව ,සී.බී. හරිශ්චන්ද්‍ර - ප්‍රධාන කාර්යාලය, එල්. ඩබ්. සම්පත් - බලංගොඩ ශාඛාව , දර්ශන - කඩුවෙල ශාඛාව, එම්.යූ.එස්. ධර්මවර්ධන - ප්‍රධාන කාර්යාලය,තිළිණි කල්පනා - ප්‍රධාන කාර්යාලය,කේ.එම් ගුණරතන - කඩුවෙල ශාඛාව ,අයි.ඊ. මධුජිත් - රත්නපුර ශාඛාව ,ප්‍රදීප් කුමාර -ප්‍රධාන කාර්යාලය, බී.එල්.සී.මධුෂානී- ප්‍රධාන කාර්යාලය, පී. එම්. යූ. කුමාරි,- කන්තලේ ශාඛාව,එම්.අයි. උමයංග - බලංගොඩ ශාඛාව,එච්.පී සංජීව - මාතලේ,එස්.ජේ බණ්ඩාර - කඩුවෙල ශාඛාව, ඩබ්.ක්‍රිශාන් - ප්‍රධාන කාර්යාලය, කේ.එම්. රමේෂ් - නාවලපිටිය ශාඛාව,ඩී.අයි.ලක්ෂාන් -කඩුවෙල ශාඛාව,අනූෂා පෙරේරා - ප්‍රධාන කාර්යාලය, කැළුම් චාමර - බලංගොඩ ශාඛාව, ආර්.රසාංජලී,- ප්‍රධාන කාර්යාලය, .කේ.කේ.එස් ප්‍රභාත් - ප්‍රධාන කාර්යාලය, කේ.ඩී.එස්. දිල්රුක්ෂි - හලාවත ශාඛාව, ඩී.ගමගේ - ප්‍රධාන කාර්යාලය, සුනන්ද මෙන්ඩිස් - ප්‍රධාන කාර්යාලය චාමර පීරිස් - ප්‍රධාන කාර්යාලය,මහේෂ් කුමාර - ප්‍රධාන කාර්යාලය,කේ.සී.එස් සිල්වා - කඩුවෙල ශාඛාව

## මෙහෙවර පැණසර ප්‍රහේලිකා අංක 07 - ජූලි අගෝස්තු කලාපයේ ජයග්‍රාහකයෝ


කේ. ඒ. ඒ. එන්. පෙරේරා
කඩුවෙල ශාඛාව


එස්.ආර්.පී. දිල්රුක්
ප්‍රධාන කාර්යාලය


සෙව්මි ද අල්මේදා
මතුගම



මෙහෙවර පැණසර ප්‍රහේලිකාව පුරවා එවීමට ඔබ දක්වන උනන්දුව දිනෙන් දිනම ඉහළ යන බව සීඝ්‍රයෙන් වැඩිවන ඔබේ විසඳුම් පත් ප්‍රමාණය සාක්ෂි දරනවා. පසුගිය කලාපයේ පළවූ මෙහෙවර පැණසර ප්‍රහේලිකාව පුරවා එවූ ඔබ අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගත් ජයග්‍රාහකයින් තිදෙනාගේ නම් ඉහත දැක්වෙනවා. මෙවර මෙහෙවර ජයග්‍රහකයින් තේරීම සඳහා අප හා එක්වූ ලීසිං අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පද්මසිරි දයාවංශ මහතාටත්, SME අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු ෂර්ලි ප්‍රනාන්දු මහතාටත්, ලීසිං අංශයේ කළමනාකරු උදාර ධනංජය මහතාටත් අපගේ ස්තූතිය.

සදීපා
• පොත් ප්‍රකාශනය • ප්‍රින්ට් හවුස්
• පොත් හල • ප්‍රින්ටර්ස්

සම්මානලාභී බෞද්ධ, සාහිත්‍ය හා අධ්‍යාපන පොත් ප්‍රකාශකයෝ

Sole Agent in Sri Lanka
PELANGI Penerbitan Sdn. Bhd. Malaysia.

කුඩා ළමුන්ට මුල සිට සරලව ඉංග්‍රීසි ඉගෙනීම සඳහා මැලේසියාවෙන් ගෙන්වන Phonics පොත් පෙළ

සී/ස සදීපා ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS (PVT) LTD
1060, මරදාන පාර, බොරැල්ල

දුරකථන : 011-2686114, 2694289, 2678043
ෆැක්ස් : 011-2678044
Email : sadeepapub@gmail.com

බොරුවට ලැජ්ජා වීමද බියකි.

# Atlas සිත්තර යාළු

## පුංචි අපේ චිත්‍ර පිටුව

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. ''සිත්තර යාළු චිත්‍ර පිටුවෙහි පළවන චිත්‍ර අතරින් **තෝරා ගනු ලබන හොඳම චිත්‍ර තුනක් සඳහා සිලෝන් පෙන්සිල් කොම්පැණි (ඇට්ලස්) මගින් පිරිනමනු ලබන වටිනා ත්‍යාග කට්ටල තුනක් පිරිනමනු ලබන** අතර ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන **ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ සංස්කාරක, චිත්‍ර පිටුව, එච් එන් බී ග්‍රාමීන් ගොඩනැගිල්ල, අංක 168, නාවල පාර , නුගේගොඩ. යන ලිපිනයට නොපමාව යොමු කරන්න.**

### Atlas සිත්තර යාළු
### ජූලි - අගෝස්තු කලාපයේ ජයග්‍රාහකයෝ

| | |
|---|---|
| අපේ ගෙදර වෙසක් - | නිදුක දෙනෙත් සේනාරත්න<br>2 ශ්‍රේණිය<br>කසුන් උපේන්ද්‍ර සේනාරත්න<br>කෑගල්ල ශාඛාව |
| ගම්මානය - | ආර්.එම්.සොනක්ෂි සත්මිනි<br>2 ශ්‍රේණිය<br>(භාරකරුගේ නම සඳහන් නැත)<br>නුවර-එළිය ශාඛාව |
| පැරෂුටය - | සදූප හසරැල් රණවීර<br>3 ශ්‍රේණිය<br>කමල් ප්‍රියංග<br>ප්‍රධාන කාර්යාලය |



අපේ පිට්ටනිය
උතුල් බුද්මිණ - 3 ශ්‍රේණිය
(බුද්ධික තන්ත්‍රිගේ - ප්‍රධාන කාර්යාලය)



මගේ ගෙවත්ත
ටී.එම්. මයුමි පබසරා තෙලිසිංහ - 3 ශ්‍රේණිය
(ටී.එම්.එස්. උදය කුමාර - හලාවත ශාඛාව)





මගේ සරුංගලේ
නිතිනි දිනෙත්මා - 1 ශ්‍රේණිය
(මහේෂ් උදය - අම්බලන්ගොඩ ශාඛාව)



මම ආසම නැව
කවිත් රන්දිව් - 2 ශ්‍රේණිය
(ටී.එම්.එස්. තිලකරත්න - නිකවැරටිය ශාඛාව)



උදෑසන අසිරිය
ටී.එම්. නෙත්මි සත්සරණි - 4 ශ්‍රේණිය
(ටී.එම්.එස්. තිලකරත්න - නිකවැරටිය ශාඛාව)



## රමේෂ් ෆොන්සේකා මහතා සිව්වන වරටත් ශ්‍රී ලංකා ක්ෂුද්‍ර මූල්‍ය වෘත්තිකයින්ගේ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයට

HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ සහකාර සාමාන්‍යාධිකාරී(අනුකූලතා) රමේෂ් ෆොන්සේකා මහතා ලංකා ක්ෂුද්‍ර මූල්‍ය වෘත්තිකයින්ගේ සංගමයේ (Sri Lanka Micro Finance Practitioners' Association) අධ්‍යක්ෂකවරයකු වශයෙන් (2017/2018 ) පසුගියදා නැවත වතාවක් තේරී පත්විය.

2013 වර්ෂයේ සිට ලංකා ක්ෂුද්‍ර මූල්‍ය වෘත්තිකයින්ගේ සංගමයේ අධ්‍යක්ෂකවරයකු වශයෙන් කටයුතු කළ ඒ මහතාට HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය සිය සුභාෂිංශන මෙසේ පළ කර සිටී.

# සුරක්ෂිත ළමා පරපුරක් උදෙසා HNB ග්‍රාමීන් පෙරමුණ ගනී

**ශ්‍රී ලාංකීය ළමා පරපුර මුහුණ දෙන ළමා අපචාර සම්බන්ධයෙන් සමස්ත සමාජය දැනුවත් කිරීමේ අරමුණ ඇතිව " සුරක්ෂිත ළමා පරපුරක් උදෙසා" මැයෙන් HNB ග්‍රාමීන් ෆයිනෑන්ස් ලිමිටඩ් මගින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ සම්මන්ත්‍රන මාලාවක තවත් එක් සම්මන්ත්‍රනයක් පසුගිය සැප්තැම්බර් 14 වෙනි දින වැලිගම පොලීසිය සහ වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවිධාන දායකත්වය ඇතිව මාතර වැලිගම නගරය කේන්ද්‍ර කරගනිමින් වැලිගම නගර සභා සම්මන්ත්‍රන ශාලා පරිශ්‍රයේදී අති සාර්ථක ලෙස පවත්වන ලදි.**

රටේ ආර්ථික හා සමාජ සංවර්ධන ක්‍රියාවලිය සඳහා නිබදවම උරදෙන HNB ග්‍රාමීන් සමාගම සිය සමාජ වගකීම මැනවින් හඳුනාගනිමින් සමාජ සත්කාරක කටයුතු සඳහාද වඩාත් සක්‍රීය දායකත්වයක් දක්වනු ලබන සමාගමකි. ''සුරක්ෂිත ළමා පරපුරක් උදෙසා'' මැයෙන් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව ඉන් එක් පියවරකි. ශ්‍රී ලංකා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ මහජන සම්බන්ධතා අංශයේ ස්ථානාධිපති, ප්‍රවීන දේශක මනෝජ් සමරසේකර මහතා විසින්



මෙහෙයවන ලද මෙම අවස්ථාවට වැලිගම ප්‍රාදේශීය ලේකම් සුමිත් ශාන්ත,මාතර දිස්ත්‍රික් තුන භාර සහකාර පොලිස් අධිකාරී දිනිදු සේනානායක, වැලිගම ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත බුද්ධික යන මහත්වරුන්ද HNB ග්‍රාමීන් ප්‍රධාන කාර්යාලයේ සහ මාතර ශාඛාවේ නිළධාරීහුද ආරාධිතයන් ලෙස සහභාගී වූහ.



# නගර ශාඛාවෙන් ලේ දන්දීමේ කඳවුරක්...

**HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් හි නගර ශාඛාවේ බොරැල්ල මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ වැඩසටහනක් පසුගියදා බොරැල්ල වනාතමුල්ල මහල් නිවාස ප්‍රජා ශාලාවේදී පෙ.ව. 9.00 සිට ප.ව. 6.30 දක්වා පවත්වන ලදි. ඉතා සාර්ථක අයුරින් පවත්වන ලද ලේ දන්දීමේ අවස්ථාවට අවට ප්‍රදේශවාසී ලේ දන්දෙන්නන්ගෙන් ඉහළ දායකත්වයක් ලැබුණු අතර HNB නගර ශාඛාවේ නිළධාරීන් සහ බොරැල්ල මධ්‍යස්ථාන සාමාජිකාවන් මේ අවස්ථාවට එක්වූහ.**








HNB GRAMEEN මෙහෙවර
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර
නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් : 0112825843
ඊ-මේල් :- manjula.p@hnbgrameen.lk
වෙබ් :- www.hnbgrameen.com

අධික්ෂණය :- චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- තිළිණ දිසානායක
මුද්‍රණය :- අර්ජුනග්‍රැෆික්ස්, රත්තණපිටිය.
ඡායාරූප ශිල්පි :- ලක්ෂ්මන් කුමාරතුංග

## Happy Birthday

ඔක්තෝබර් මාසයේ උපන්දිනය සමරන
එච් එන් බී ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත
අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමග පිරිනමමු !

| නම | දිනය | ශාඛාව |
|---|---|---|
| [redacted] | | |
| අමිල සාලින්ද මහතා | ඔක්තෝබර් 10 | පොළොන්නරුව |
| එන් .සිවරූබන් මහතා | ඔක්තෝබර් 10 | ප්‍රධාන කාර්යාලය |
| එස් .කජේන්තිරන් මහතා | ඔක්තෝබර් 10 | නෙල්ලිඅඩි |
| ලහිරු ප්‍රියංකර මහතා | ඔක්තෝබර් 10 | මැදවච්චිය |
| ශ්‍රීමාල් දර්ශන මහතා | ඔක්තෝබර් 10 | ජාඇල |
| දුමින්ද සම්පත් මහතා | ඔක්තෝබර් 11 | ගල්ගමුව |
| පී සුදර්ශන් මහතා | ඔක්තෝබර් 11 | මඩකලපුව |
| පියුම් තාරක මහතා | ඔක්තෝබර් 11 | මොනරාගල |
| අමිල් තුෂාර මහතා | ඔක්තෝබර් 11 | මොරවක |
| චරිත් සුරංග මහතා | ඔක්තෝබර් 12 | කන්තලේ |
| ලලිත් රොහාන් මහතා | ඔක්තෝබර් 12 | කුරුණෑගල |
| ආර් සුදර්ශන් මහතා | ඔක්තෝබර් 12 | නැදුන්කර්නි |
| පුෂ්ප කුමාර මහතා | ඔක්තෝබර් 12 | වෙන්නප්පුව |
| තරංග ඩිල මහතා | ඔක්තෝබර් 12 | නිට්ටඹුව |
| ඊශාන් දර්ශන මහතා | ඔක්තෝබර් 12 | පුත්තලම |
| කසුන් විජේවර්ධන මහතා | ඔක්තෝබර් 12 | පොළොන්නරුව |
| ඩේවිඩ් ඩග්ලස් මහතා | ඔක්තෝබර් 12 | මඩකලපුව |
| එන්. මහේන්ද්‍ර රගු මහතා | ඔක්තෝබර් 13 | ත්‍රිකුණාමලය |
| ජේ කුමාර ගුණදාස මහතා | ඔක්තෝබර් 13 | මැදවච්චිය |
| අමිල සංජීව මහතා | ඔක්තෝබර් 13 | ප්‍රධාන කාර්යාලය |
| ගෙවිදු මලිත් මහතා | ඔක්තෝබර් 13 | ජාඇල |
| වී.විනෝජන් මහතා | ඔක්තෝබර් 13 | පුත්තලම |
| රාජ්කුමාර් ඉන්ද්‍රප්‍රසාත් මහතා | ඔක්තෝබර් 13 | ප්‍රධාන කාර්යාලය |
| අරුණ ශිවන්ත මහතා | ඔක්තෝබර් 14 | ප්‍රධාන කාර්යාලය |
| සුජිත් ප්‍රියංකර මහතා | ඔක්තෝබර් 14 | මොරවක |
| අනුෂ්ක ගයාන් මහතා | ඔක්තෝබර් 14 | බෙලිඅත්ත |
| සමීර නිරෝෂණ මහතා | ඔක්තෝබර් 14 | මාතලේ |
| සරත් කුමාර් මහතා | ඔක්තෝබර් 14 | මොනරාගල |
| චතුරංග වික්‍රමසිංහ මහතා | ඔක්තෝබර් 14 | වත්තල |
| ධනුෂ්ක නලීන් මහතා | ඔක්තෝබර් 14 | දඹුල්ල |
| ප්‍රදීප් සමන් මහතා | ඔක්තෝබර් 14 | බණ්ඩාරගම |
| ඉෂාර මධුෂ්ක මහතා | ඔක්තෝබර් 14 | අනුරාධපුර |
| යූ උදයනාදන් මහතා | ඔක්තෝබර් 14 | නෙල්ලිඅඩි |
| ධනංජය නාමල් මහතා | ඔක්තෝබර් 15 | පොළොන්නරුව |
| ධනුෂ්ක ප්‍රභාත් මහතා | ඔක්තෝබර් 16 | ප්‍රධාන කාර්යාලය |
| ප්‍රසන්න චාමර මහතා | ඔක්තෝබර් 16 | මොරටුව |
| තරංග උදය කුමාර මහතා | ඔක්තෝබර් 16 | අම්පාර |
| නිරාජ් ශක්ති මහතා | ඔක්තෝබර් 16 | නගර ශාඛාව |
| හසිත ලක්රුවන් මහතා | ඔක්තෝබර් 16 | කළුතර |
| රුචිර ලක්ශාන් මහතා | ඔක්තෝබර් 16 | ප්‍රධාන කාර්යාලය |
| එස්. දර්ශන් මහතා | ඔක්තෝබර් 16 | නෙල්ලිඅඩි |
| මේනක පෙරේරා මහතා | ඔක්තෝබර් 17 | බදුල්ල |
| ආර්. නිරංජන් මහතා | ඔක්තෝබර් 17 | කල්මුනේ |
| චින්තක අබේරුවන් මහතා | ඔක්තෝබර් 18 | මීගමුව |
| ටී චන්ද්‍රසිරි මහතා | ඔක්තෝබර් 18 | මාතලේ |
| කපිල නිශාන්ත මහතා | ඔක්තෝබර් 18 | මාතර |
| චමින්ද සම්පත් මහතා | ඔක්තෝබර් 18 | පදවිය |
| ජනේෂ් චාමිකර මහතා | ඔක්තෝබර් 18 | ගාල්ල |
| අයන්ත ශානුක මහතා | ඔක්තෝබර් 18 | නොරොච්චෝලෙ |
| අනුරාධ පෙරේරා මහතා | ඔක්තෝබර් 18 | මොරටුව |
| තිළිණ සඳරුවන් මහතා | ඔක්තෝබර් 19 | ප්‍රධාන කාර්යාලය |
| චමින්ද අත්තනායක මහතා | ඔක්තෝබර් 19 | බණ්ඩාරවෙල |
| චිරන්ද පුෂ්ප කුමාර මහතා | ඔක්තෝබර් 19 | වෙන්නප්පුව |
| තිසර රුක්ෂාන් මහතා | ඔක්තෝබර් 19 | නගර ශාඛාව |
| ආර්. කෝබිදාසන් මහතා | ඔක්තෝබර් 19 | යාපනය |
| සදුන් තාරක මහතා | ඔක්තෝබර් 19 | ගාල්ල |
| ලහිරු දේශප්‍රිය මහතා | ඔක්තෝබර් 19 | මාතර |
| සංජීව පුෂ්පකුමාර මහතා | ඔක්තෝබර් 20 | බණ්ඩාරවෙල |
| ජයසිරි බණ්ඩාර මහතා | ඔක්තෝබර් 20 | පොතුවිල් |
| රුක්ෂාන් දිල්රුක් මහතා | ඔක්තෝබර් 20 | ප්‍රධාන කාර්යාලය |
| මහේෂ් කාලිංග මහතා | ඔක්තෝබර් 20 | මොනරාගල |
| කසුන් මධුශංක මහතා | ඔක්තෝබර් 20 | ප්‍රධාන කාර්යාලය |
| ඉමේෂ් මධුශංක මහතා | ඔක්තෝබර් 20 | කඩුවෙල |
| දිලීප් පද්ම කුමාර මහතා | ඔක්තෝබර් 21 | දඹුල්ල |
| රොෂාන් නවරත්න මහතා | ඔක්තෝබර් 21 | බණ්ඩාරගම |
| කේ. ජයකුමාර් මහතා | ඔක්තෝබර් 21 | අම්පාර |
| කේ. වර්ණදාස් මහතා | ඔක්තෝබර් 21 | නෙල්ලිඅඩි |
| ඉසුරු සඳකැළුම් මහතා | ඔක්තෝබර් 21 | හෝමාගම |
| ලහිරු මධුශංක මහතා | ඔක්තෝබර් 21 | කඩුවෙල |
| ෂම්පත් ප්‍රියන්ත මහතා | ඔක්තෝබර් 22 | නුවර |
| තරිදු ගුණවර්ධන මහතා | ඔක්තෝබර් 22 | හෝමාගම |
| හසිදු ලක්ෂාන් මහතා | ඔක්තෝබර් 22 | කළුතර |
| ටී සුතන්රාජ් මහතා | ඔක්තෝබර් 23 | යාපනය |
| අරුලම්පලම් ජෙනරතනන් මහතා | ඔක්තෝබර් 24 | වවුනියා |
| ලහිරු දිසානායක මහතා | ඔක්තෝබර් 24 | හෝමාගම |
| මෙත්ම හසදුන් මහතා | ඔක්තෝබර් 24 | නුවර |
| ලක්මාල් ප්‍රදීප් මහතා | ඔක්තෝබර් 24 | මොරවක |
| ප්‍රසාද් මධුශංක මහතා | ඔක්තෝබර් 25 | ඇඹිලිපිටිය |
| රුසිත් මධුහංස මහතා | ඔක්තෝබර් 25 | වත්තල |
| කනිල් පෙරේරා මහතා | ඔක්තෝබර් 26 | ප්‍රධාන කාර්යාලය |
| ශිවකුමාර් විජිතාර් මහතා | ඔක්තෝබර් 26 | මුලතිවු |
| සුපුන් සුබෝධ මහතා | ඔක්තෝබර් 26 | නොච්චියාගම |
| ලසන්ත බිනරගම මහතා | ඔක්තෝබර් 27 | නොච්චියාගම |
| ගීත් කනුෂ්ක මහතා | ඔක්තෝබර් 28 | හම්බන්තොට |
| සුරම්‍ය පුෂ්පක මහතා | ඔක්තෝබර් 28 | පුත්තලම |
| නුවන් සමීර මහතා | ඔක්තෝබර් 28 | හලාවත |
| යසින්ත දිල්රුක් මහතා | ඔක්තෝබර් 28 | නගර ශාඛාව |
| බී.කවිනාත් මහතා | ඔක්තෝබර් 28 | මඩකලපුව |
| රෝහිත ඉංදික පීරිස් මහතා | ඔක්තෝබර් 29 | මොරටුව |
| කවිදු කාංචන මහතා | ඔක්තෝබර් 29 | ප්‍රධාන කාර්යාලය |
| ප්‍රියන්ත ඩි අල්විස් මහතා | ඔක්තෝබර් 30 | ප්‍රධාන කාර්යාලය |
| සුරංග දර්ශන හේරත් මහතා | ඔක්තෝබර් 30 | මැදවච්චිය |
| රාජන් නිශාන්තන් මහතා | ඔක්තෝබර් 30 | වවුනියා |
| එම් නවක්චන්ද්‍රන මහතා | ඔක්තෝබර් 30 | මන්නාරම |
| ෂෙහාන් සංකල්ප මහතා | ඔක්තෝබර් 30 | පුත්තලම |
| තිළිණ මධුශංක මහතා | ඔක්තෝබර් 31 | බණ්ඩාරවෙල |
| චමීර ප්‍රියදර්ශන මහතා | ඔක්තෝබර් 31 | බදුල්ල |
| තරිදු ගුණවර්ධන මහතා | ඔක්තෝබර් 31 | හලාවත |
| බුද්ධි ප්‍රියරංග මහතා | ඔක්තෝබර් 31 | මාතර |
| දිලීප නුවන් මහතා | ඔක්තෝබර් 31 | හලාවත |
| වීජිත කුමාර මහතා | ඔක්තෝබර් 31 | කුරුණෑගල |
| හර්ෂ කුමාර මහතා | ඔක්තෝබර් 31 | කැකිරාව |